# 1968 ආර්ථික හැඩගැස්ම, ගැටලු හා ප්‍රතිපත්ති

## හැඳින්වීම

කෘෂිකාර්මික හා කාර්මික අංශයන්හි දේශීය වශයෙන් නිෂ්පාදනය කොට පාරිභෝජනයට ගනු ලැබූ භාණ්ඩයන් ගේ පරිමාව වැඩි වේගයකින් පුළුල්වීම 1968 ආර්ථික වර්ධනයේලා පෙනුණු ප්‍රධාන ලක්ෂණය විය. අපනයන ඉපැයීම් සැලකිය යුතු පරිදි දියුණුවීම, හේතු කොට ගෙන නිමැවුමෙහි ඇති වූ මෙම වැඩිවීම තවදුරටත් ශක්තිමත් විනි.

ලෝක වෙළෙඳ පොළේ අවාසිදායක තත්ත්වයක් පවතිද්දීත්, දේශීය පාරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි ස්ථාපිතවූ සැලකිය යුතු වර්ධන වේගයක්, ඇති කර ගැනීමෙහිලා ලංකා ආර්ථිකය සමත්වී ඇති බැව් 1967 වාර්ෂික වාර්තාවේ සඳහන් කර තිබුණි. 1967 වර්ෂය තුළ දී ආර්ථිකයේ පුනරුත්ථානයක් ඇති කළ බලවේග 1968 දී තවදුරටත් බලවත් වූයෙන්, ආර්ථිකය වඩාත් වේගයෙන් වර්ධනය විය. ආර්ථික සංවර්ධනයට මුල් වූ කරුණු පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් සම්පිණ්ඩනය කොට දක්වා ඇත :—

### 1 — (1) වැනි සංඛ්‍යා සටහන

**ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන අංගයන්**

(ස්ථාවර මිල අනුව)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂ | 1966 | 1967 | 1968 |
|---|---|---|---|
| ඉකුත් වසරට වඩා ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදනයේ වැඩිවීම ... ... | +283 | +347 | +680 |
| 1- කෘෂිකර්මාන්තයේ එකතුව ... ... | + 64 | +203 | +209 |
| (අ) අපනයන ... ... ... ... | — 37 | + 16 | + 56 |
| (ආ) වෙනත් කෘෂිකර්මාන්ත ... | +101 | +187 | +153 |
| 2. නිපදවීම් ... ... ... ... | + 71 | + 44 | + 81 |
| 3. ප්‍රවාහන, ගබඩා සහ පණිවුඩ හුවමාරු ... | + 52 | — 10 | + 42 |
| 4. තැනීම් ... ... ... ... | + 27 | + 58 | + 95 |
| 5. වෙනත් ... ... ... ... | + 69 | + 52 | +253 |

පැහැදිලිවම, දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීමෙහිලා අපනයනය සඳහා නොවන දේශීය කෘෂිකර්මය, 1966 සිට සැලකිය යුතු පරිදි දායක විය. වී නිෂ්පාදනය ඊට කලින් වසරේ පැවැති පහළ මට්ටමින් මිදී එම වසරේදී සැලකිය යුතු තරම් උසස් මට්ටමකට එළඹියේ ය. ඉන් පසුව මෙම අංශයේ වර්ධනය හීනවීමට ඉඩ නොදී, පවත්වා ගනු ලැබූ අතර, සහල් වැනි ආනයන කළ භාණ්ඩයන් ගේ මිල වැඩිවීම නිසා වෙළෙඳ අනුපාතිකයේ අසතුටුදායක ක්‍රියාකාරිත්වය වැනි බාහිර සාධකයන් නිසා ආර්ථිකයේ ඇතිවූ පිරිහීම පමණටත් වඩා මකාලීය.

ස්ථාවර මිල අනුව ( එනම්, මූර්ත වශයෙන් ) දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම් වේගය සියයට 4.4 ක්ව පැවැති ඉකුත් වසර හා සසඳන කල්හී, 1968 දී එය 8.3 ක්ව පැවැතිනි. වසරේ දී ජනගහනයේ ඇතිවූ සියයට 2.2 ක වර්ධනය පිළිබඳ ගැලපිළි කළ පසු සියයට 6.1 ක් වූන, ඒකජන මූර්ත නිෂ්පාදිතයේ වැඩිවීම මේතාක් ලබා ඇති ඉහළ ම වර්ධන වේගය වෙයි. වෙළෙඳ අනුපාතිකය සියයට 7.9 කින් අඩු නොවූයේ නම්, මූර්ත ආදයම මෙයට වැඩි වේගයකින් ඉහළ නඟිනු ඇත.

රුපියල් වටිනාකම අනුව බලන කල, 1967 දීට වඩා 1968 දී ගෙවුම් ශේෂ තත්වය අයහපත් විය. මූර්ත ජාතික නිෂ්පාදිතයේ ඉහළ වර්ධන වේගයත් සමගම, ඉකුත් වසරේදීට වඩා විශාල ආනයන අතිරික්තයක් ඇති විනි. එහෙත්, ඩොලර් වටිනාකම අනුව බලන කල 1968 දී පැවැති ආනයන අතිරික්තය ඉකුත් වසරේදීට වඩා අඩු ය. 1967 දී සියයට 1.1 කින් වැනි සුළු ප්‍රමාණයකින් ආනයන අගය පහළ යාමෙන් පසු, 1968 දී ආනයන අගය සියයට 18 කින් ඉහළ ගියේය. ආනයනයන්හි ඇති වූ මෙම වැඩිවීම, අවප්‍රමාණ කිරීම හේතු කොට ගෙන රුපියල් මිල වැඩිවීමේ සහ 1968 මැයි මාසයේ දී යොද ගනු ලැබූ විනිමය සංශෝධනයන්ට අනතුරුව ආනයනය කටයුතු ලිහිල් කිරීමේ ප්‍රතිඵලයකි. ඉකුත් වසරේ පහළ වැටීම අනුව බලන කල අපනයන ඉපැයීම් රුපි. දශ ලක්ෂ 345 කින් වැඩි වූවත්, 20 % ගෙවුම් ශේෂ තත්වයෙහි මතු වූ උපනතිය මැඩ පැවැත් වීමට තරම් ප්‍රමාණවත් නොවීය. අපනයන ඉපැයීම් වෙගයෙන් ඉහළ යාම මුළුමනින්ම වාගේ මිලෙහි වැඩිවීම හා ඉතා සුළු වශයෙන් පරිමාවෙහි වැඩිවීම පිළිබිඹු කරයි.

1967 වන විට, දැඩි පාලන ක්‍රම මගින් ගෙවුම් ශේෂයන්හි මතුවන ප්‍රධාන ප්‍රශ්න නිරාකරණය කරගත නොහැකි බව පෙනී යන්නට විය. 1968 මැයි මාසයේ දී විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය (වි.වි හි.ස.) ඇරඹීමත්, එයට ටික කලකට පෙර එනම්, 1967 නොවැම්බරයේදී රුපියල අවප්‍රමාණ කිරීමත්, මෙකී ප්‍රශ්නය විසඳීමෙහිලා අනුගමනය කළ ප්‍රධාන ක්‍රියා මාර්ගයකි. ආනයනයන් බොහොමයකම රුපියල් වටිනාකම, විදේශීය විනිමයෙහි තාත්වික වටිනාකමට ආසන්න කිරීමටත්, එසේම ආර්ථිකයේ දියුණුවන අංශවල වර්ධන වේගය තියුණු කිරීමට හැකි වනු පිණිස, විශේෂයෙන්ම කර්මාන්තවලට අත්‍යාවශ්‍ය අමු ද්‍රව්‍යයන් ගේ ආනයන ලිහිල් කිරීමට සලස්වන ලදී. මෙම ක්‍රමය පිළිබඳ විස්තර වෙනත් තැනක සාකච්ඡා කරනු ඇත.

දුර්වල ගෙවුම් තත්වයකට මුහුණපා සිටින ලංකාවට වැඩිපුර විදේශාධාර ලබා ගැනීම හා ඒවා අඛණ්ඩව ගලා ඒම කෙරෙහි දැඩි ලෙසින්ම බැඳී සිටීමට සිදු වනු ඇත. ඇත්ත වශයෙන් ම, 1968 දී ඇතිවූ විශාල ගෙවුම් ශේෂ හිඟය පියවීම සඳහා මුදල් යොද ගනු ලැබූයේ බොහෝ සෙයින්ම ද්‍රව්‍යාධාර හා යෝජනා ක්‍රම ආධාර සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආධාර ද ඇතුළත්, කෙටි කාලීන ණය මගිනි. මේ හේතුව නිසා විදේශීය සංචිත ප්‍රයෝජනයට ගැනීම සිදුවූයේ මඳ වශයෙනි. 1968 දී ගෙවුම් ශේෂයේ, 1967 දීට වඩා විශාල හිඟයක් ඇති වුවද, ශුද්ධ විදේශීය බැංකු වත්කම් පහත වැටුනේ මඳ වශයෙනි.

මුළු නිමැයුම අනුව බලන කල, 1968 දී ආනයන අගය ඉහල ගොස් ඇත. ඉකුත් වසර කීපය තිස්සේ සපුරාගත නොහැකි වීමෙන් එක් රැස්වුනු ඉල්ලුමක් පැවතියේ ය. මෙවැනි තත්වයක් යටතේ විදේශීය වෙළෙඳාම් සහ විදේශීය ගෙවුම් පිළිබඳ පාලනයන් ලිහිල් කිරීම හේතු කොට ගෙන ආනයන අගය වැඩිවීම සාමාන්‍යයෙන් බලාපොරොත්තු විය හැකි ප්‍රවනතාව යකි. ආනයනයන් 25 % කින් වැඩි වූ අතර, එම වැඩිවීමෙන් අඩක් පමණ පාරිභෝජන භාණ්ඩ වූ අතර, 34 % ක් පමණ අන්තර් භාණ්ඩ විය. ශුද්ධ විදේශීය බැංකු වත්කම් රුපි. දශ ලක්ෂ 116 කින් අඩු වූ නමුත්, රජයට ලබාදුන් ණය රුපි. දශ ලක්ෂ 192 කින් ද, පෞද්ගලික අංශයට ලබාදුන් ණය රුපි. දශ ලක්ෂ 264 කින් ද ප්‍රසාරණය වූ නිසා එසේ විදේශීය වත්කම් පහත වැටීම නිසා ඇති වූ මූල්‍ය බලපෑම පමණටත් වැඩියෙන් හිලව් වී ගියේ ය. පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය මෙම වසර තුලදී උච්චස්ථානයකට එළඹියේය. මාසික මුදල් සැපයුමෙහි සාමාන්‍ය මට්ටම 7 % කින් ඉහළ ගිය අතර, එය ඉකුත් වර්ෂයේ දී වූ ප්‍රසාරණයට වඩා අඩු ය.

මුදල් සැපැයුමෙහි පහළ මට්ටමක ප්‍රසාරණයක් සහ මූර්ත නිෂ්පාදිතයෙහි වූ ඉහළ වේගයක වර්ධනයක් සිදු වෙද්දී, මේ වර්ෂයේ මිල මට්ටම 1967 දී ඉහල ගියාට වඩා වැඩි වේගයකින් ඉහළ ගියේ ය. පසුගිය වර්ෂවල දී මුදල් සැපැයුමෙහි ප්‍රසාරණය එම වර්ෂවල මූර්ත නිමැයුමෙහි පුළුල් වීමට වඩා බොහෝ සෙයින් වැඩි වූ බව මතක් කර දෙන ලදී. ආනයන හා විනිමය පාලනය දැඩි ලෙස පවත්වා ගෙන ආ නිසා මෙම මූල්‍ය ප්‍රසාරණය ආර්ථිකයෙන් කාන්දුවී, ගෙවුම් ශේෂ හිඟයක් ඇති කිරීම කෙරෙහි සම්පූර්ණයෙන්ම බල නොපෑවේ ය. එසේ ම දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ සැපැයුම මෙම අතිරේක ද්‍රව්‍යශීලතාවය සමහන් කිරීමෙහිලා ප්‍රමාණවත් නොවීය. මිල පාලන හා සලාක ක්‍රම තත්වයන් යටතේ සාමාන්‍යයෙන් පාලනය කොට තබා ගත හැකි සීමාවන් ඇතුළත මිල ඉහළ යෑම වලක්වා තබා ගන්නා ලදී. මේ අනුව ඉකුත් වසර කිහිපය තුලදී ආර්ථිකයෙහි ගොඩනැගුණු, සැලකිය යුතු ප්‍රමාණයක මර්දිත ඉල්ලුමක් 1967 අවසානයේදී පැවතින. 1967 දී මහජනයා අත වූ ද්‍රවශීලතා ප්‍රමාණය ඇත්තෙන්ම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 45 ක් තරම් විශාල විය. මෙම ද්‍රව්‍යශීලතා අනුපාතය 1968 දී සියයට 43 දක්වා පහළ වැටුනු අතර, මුදල්වල ආදයම් ප්‍රවේගය 4.1 සිට 5.1 දක්වා

ඉහළ ගියේ ය. 1968 දී මුදල් ප්‍රසාරණය 1967 දීට වඩා අඩු වූ අතර, මූර්ත නිෂ්පාදිතයේ පුළුල්වීම කලින් වර්ෂයේදීට වඩා සෑහෙන තරම් විශාල විය. ඉකුත් වර්ෂ වලදී මර්දිතව පැවැති ඉල්ලුම සමග එක් වූ ඉහළ සංසරණ ප්‍රවේගය, මිල මට්ටම ඉහළ නැංවීමෙහිලා හේතු විය.

රජයේ ආදායම සියයට 10.3 කින් වැඩි වූ නමුත්, රජයේ මුළු වියදම ඉකුත් වර්ෂයේදීට වඩා සියයට 12.1 ක වේගයෙන් ඉහළ නැගුණි. ආදායම් අංශයෙහි ප්‍රධාන වැඩිවීම සිදුවූයේ, අපනයන බදුවල, දේශීය භාණ්ඩ බදුවල ආදායම්හි සහ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර අලෙවියෙන් ලැබූ ලාභයන්හිය. වැඩිවූ වියදම් වලින් සියයට 71 ක්ම වර්තන වියදම් සඳහා වූ අතර, ඉතිරි ප්‍රමාණය ප්‍රාග්ධන වියදම් සඳහා විය.

වෙළෙඳ බැංකු වෙතැති ඉතිරි කිරීමේ තැන්පතු රු. දශ ලක්ෂ 125 කින් වැඩි වූ අතර, අනෙක් වර්ගවල ආයතනික ඉතිරි කිරීම් රුපි. දශ ලක්ෂ 30 කින් ඉහළ ගියේය. ඉතිරි කිරීම්වල මෙම වැඩිවීම, දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමෙන් සියයට 10 කට ආසන්න විය. ඉතිරි කිරීම් සම්බන්ධ මෙම සංඛ්‍යාවට, ආදායම වැඩිවීම නිසා මෙම වර්ෂය තුළදී ඉහළ යන්නට ඇති අනෙකුත් වර්ගවල පෞද්ගලික ඉතිරි කිරීම් ඇතුළත් වන්නේ නැත.

1968 වර්ෂයේ දී ද, ඉකුත් දස වසර තුළ දීමෙන් ම ( 1965 දී ඇති වූ සුළු අතිරික්තය හැර ) දළ දේශීය වියදම ආර්ථිකයට පැවැති සම්පත් ප්‍රමාණය ඉක්මවා තිබුණි. මෙම අමතර වියදම් පියවා ගනු ලැබුයේ, විදේශීය ඉතිරි කිරීම් ( වත්කම් ) ප්‍රයෝජනයට ගැනීම සහ ජාත්‍යන්තර ප්‍රදානයන් හා පැවරීම් මගිනි.

1968 දී ලංකාව ඇගේ ආදායම් ඉක්මවා වියදම් කර තිබේ. පාරිභෝජනය හා ආයෝජනය වෙනුවෙන් කරන ලද මුළු වියදම, නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවාවල අගය සියයට 3.6 ඉක්මවීය. මෙම හිඟය පියවා ගනු ලැබුයේ, විදේශීය ණයගැතිභාවය වැඩිකර ගැනීමෙන් හා විදේශාධාර වලිනි.

## (1) ආර්ථික හැඩගැස්ම

### (අ) ජාතික නිෂ්පාදිතය

1968 දී මූර්ත ජාතික නිෂ්පාදිතය වේගයෙන් වර්ධනය විය. මෙය ඉකුත් වසරේ දී ලැබූ වර්ධන වේගයට වඩා දෙගුණයකටත් ආසන්න විය. මහ බැංකුවේ තාවකාලික ඇස්තමේන්තු වලට අනුව දළ ජාතික නිෂ්පාදිතය, ස්ථාවර මිල අනුව, ( මූර්ත වශයෙන් ) ඉකුත් වසරට වඩා සියයට 8.3 කින් ඉහළ නැගිණි. 1967 වසරේ දී මෙහි වැඩිවීම සියයට 4.4 ක් ( ප්‍රතිශෝධිත ඇස්තමේන්තු) විය. දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල අනුව 1967 දී පැවැති රුපියල් දශ ලක්ෂ 8,224 සංඛ්‍යාවේ සිට 1968 දී රුපි. දශ ලක්ෂ 9,809 තෙක් හෙවත් සියයට 19.3 කින් වැඩි විය. මේ නයින් බලන කල, මිල අවපාතිකයක් අනුව පදනම් කොට ගලපා ගත්කල සියයට 11 කින් පමණ සාමාන්‍ය මිල වැඩිවීමක් දක්නට ලැබිණි. අවප්‍රමාණ කිරීමට පසුව අපේක්ෂා කළයුතු පරිදි මෙම මිල වැඩිවීම විශේෂයෙන්ම අවධාරණාත්මක වූයේ අපනයන සහ ආනයන ක්ෂේත්‍රයන්හිය. නිපදවීමෙහි හා තැනීම්හි මිල වැඩිවීම් පිළිවෙළින් සියයට 20 ක් හා සියයට 7 ක් වූ අතර, මෙයින් අවප්‍රමාණ කිරීම සහ විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය නිසා, ආනයනය කළ භාණ්ඩයන් ගේ රුපියල් මිල වැඩිවීම පිළිබිඹු කරයි.

වෙළෙඳ අනුපාතිකයේ අසතුටුදායක ක්‍රියාකාරිත්වයන් හේතු කොට ගෙන දළ ජාතික නිෂ්පාදිතයෙහි සියයට 0.6 ක පහත වැටීමක් ඇතිවුවත්, මූර්ත ජාතික ආදායම ( එනම්, වෙළෙඳ අනුපාතිකයේ බලපෑම අනුව ගැලපූ සාධක මිල අනුව, දළ ජාතික නිෂ්පාදිතය ) සියයට 7.7 කින් වැඩි විය. අයහපත් වෙළෙඳ අනුපාතිකයේ ප්‍රතිඵලය, වූයේ මූර්ත නිෂ්පාදිතය රුපි. දශ ලක්ෂ 851 කින් අඩුකරලීමය.

අර්ධ වාර්ෂික ජනගහනය, දශ ලක්ෂ 11.96 ක් වූ බවත්, වර්ධන වේගය සියයට 2.2 ක් වන බවත්, ඇස්තමේන්තු කොට තිබේ. ජනගහනයේ වර්ධනය වේගය 1967 වසරට වඩා මඳ වශයෙන් අඩුවී තිබේ. මේ අනුව, මූර්ත ඒකජන ආදායම් සංඛ්‍යාව අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි වැඩිවීම ඉකුත් වසරට වඩා සියයට 6.1 කින් වැඩි විය. ආර්ථිකයෙහි සිදුවූ මෙම සතුටුදායක ක්‍රියාකාරිත්වයට හේතු වූයේ, කෘෂිකර්මයෙහි කාර්මික හා තැනීම් අංශවල ඇති වූ සීඝ්‍ර වර්ධනයයි. තැනීම් කටයුතුවල වර්ධන වේගය ඇත්ත වශයෙන්ම මෑත වසරවලදී නොවූ විරූ ඉහළ මට්ටමකට එළඹි අතර, එය ඉකුත් වසරේ ප්‍රමාණයට වඩා සියයට 27 කින් වැඩිවිය. මූර්ත ඒකජන ආදායම සියයට 2 කින් ඉහළ නැගි ඉකුත් වසර හා සසඳා බලන කල, 1968 දී එම වර්ධන වේගය සියයට 6.1 ක් වීම විශිෂ්ඨ ජයග්‍රහනයකි.

දළ ජාතික නිෂ්පාදිතය වැඩිවූ ප්‍රමාණයෙන් සියයට 13කට ආසන්න ප්‍රමාණයක් ආයෝජන සඳහා වෙන්කල අතර, පාරිභෝජනය සියට 87 ක් උරාගත්තේය.

මුළු පෞද්ගලික පාරිභෝජනය ඉකුත් වසරට වඩා සියයට 13 කින් වැඩි වුන අතර, එය දළ ජාතික නිෂ්පාදිතය වැඩි වන වේගයට වඩා අඩු වූයේ සුළු වශයෙනි. මෙසේ සීඝ්‍ර වේගයෙන් පෞද්ගලික පාරිභෝජනය ඉහළ නැගීම විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු කරුණක් විය. විශේෂයෙන්ම මෙයට හේතුව මෙම පෞද්ගලික පාරිභෝජනය වැඩිවීම්වලින් සමහර, ආනයන වැඩි කිරීමට හේතු විය හැකි නිසාත්, එමගින් ආනයන අතිරික්තයක් ගෙවුම් ශේෂ භිහයන් වැනි ප්‍රශ්න උද්ගත කරවන හෙයිනි. කෙසේ වෙතත් පෞද්ගලික ආයෝජනයේ ප්‍රවනතාවය ඉහළටම නැඹුරුව පැවැතිණි.

මුදල් අනුව බලන කල, ආයෝජනත්, ඉකුත් වසර ඉක්මවා සියයට 21 කින් වැඩි වී තිබේ. ඇතැම් භාණ්ඩයන් ගේ මිල සියයට 30 ක් තරම් ඉහළ නැඟ ඇති හෙයින්, මෙම ගණන් බැලීමේ දී මිල ඉහළ යාමෙන් සිදුවූ එකතුවීම් ද ඇතුලත්ව ඇත. ආයෝජන සඳහා වූ ඉල්ලුම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෞද්ගලික නිෂ්පාදන හා තැනීම් අංශයන්හි ආයෝජන වැඩිවීමේ හා සමාජයීය හා ආර්ථික පිරිවැයෙහි ප්‍රතිපාදනය පුළුල් වීම නිසා ය.

පෞද්ගලික අංශයේ හා රජයේ සංස්ථාවල ප්‍රාග්ධන භාණ්ඩයන් අනුව දළ ප්‍රාග්ධන සම්පාදනයෙන් පෙන්වාලනු ලබන කරුණක් නම්, එකතුවෙහි සියයට 45 කින් සෑදුම් ලද ගොඩනැගිලි ඉදිකිරීම රුපි. දශ ලක්ෂ 520 සිට රුපි. දශ ලක්ෂ 702 දක්වා හෙවත් සියයට 35 කින් වර්ධනය වී ඇති බවය. පැහැදිලි වශයෙන්ම මෙම සතුටුදයක ක්‍රියාකාරිත්වයට හේතු වූයේ ,ආනයන කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍යයන් විශාල වශයෙන් ලබාගත හැකිවීම, සිමෙන්ති-රෝල් කැරුණු වානේ කම්බි හා වෙනත් ද්‍රව්‍යවල දේශීය නිෂ්පාදනය, ඉහල යාම සහ ආර්ථික ක්‍රියාවලියේ ඇති වූ පොදු වර්ධනයන්ය. රාජ්‍ය සංයුක්ත මණ්ඩල විසින් යන්ත්‍ර සහ උපකරණ වෙනුවෙන් කළ ආයෝජනය දෙගුණයටත් වැඩි විය. 1967 දී ආයෝජනය කල රුපි. දශ ලක්ෂ 34.5, 1968 දී රුපියල් දශ ලක්ෂ 69.6 දක්වා වැඩි විය. වෙළෙඳ මිල අනුව බලන කල දළ දේශීය වියදම, දළ දේශීය නිෂ්පාදිතයට වඩා සියයට 3.6 කින් වැඩිවී තිබිණි. මෙම හිඟය මගහරවා ලීම සඳහා මුදල් සපයා ගනු ලැබුවේ ජාත්‍යන්තර ණයගැති භාවය වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර ත්‍යාගයන් සහ පැවරුම්වලින් ලද ශුද්ධ ලැබීම් මාර්ගයෙන්ය.

## 1968 රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය වර්ධනය

### 1967-68 රජයේ අය-වැය ලේඛනය

තාවකාලික සංඛ්‍යාවන්ට අනුව රජයේ ආදායම් එකතුවීම් 1967/68 දී රුපි. දශ ලක්ෂ 2,156.4 ක් වූ අතර, එය ඉකුත් මුදල් වර්ෂයේදී එකතු කර ගැනීම්වලට වඩා රුපි. දශ ලක්ෂ 201.6 කින් ( හෙවත් සියයට 10.3 ) වැඩි විනි.

ඉකුත් වර්ෂ දහය තුළ දී සාමාන්‍ය ආදායම වැඩිවන වේගය වර්ෂයකට සියයට 5.4 ක් විය. 1966/67 දී වැඩිවීම සියයට 6.2 ක් විය. 1967/68 දී ආදායම් එකතුවල සතුටු දයක ක්‍රියාකාරිත්වයට හේතුවූයේ, වියදම් කිරීමේ අවස්ථාවේදීම සෘජු බදු ස්වරූපයෙන් සහ වි. වි. හි.ස. විකුණුම් වල ලාභයන්ගේ ස්වරූපයන් ආදායම් අයකර ගැනීම සඳහා ගත් ක්‍රියා මාර්ගයන්ය.

1968 මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දී විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයෙන් රුපියල් දශ ලක්ෂ 77 ක් පමණ එකතු කර ගන්නා ලදී. අපනයන බදු ආදායම් ඉහළ යාම, තේ හා රබර්වලින් අය කළ අපනයන බදු ඉහළ යාම, අවප්‍රමාණ කිරීමෙන් අනතුරුව මිල ඉහළයාම සහ අපනයන පරිමාව මඳ වශයෙන් වැඩිවීම නිරූපනය කරයි. රුපි. දශ ලක්ෂ 30 ක් වූ ආනයන තීරුබදු පහල වැටීම 1966/67 දී සියයට 27.8 සිට 1967/68 දී සියයට 23.8 දක්වා වූ නිසා අයභාර ව්‍යුහයෙහිලා එහි වැදගත්කම අඩු කරන ලදී.

මෙම පහත වැටීමට හේතු වූයේ ඇතැම් ශීර්ෂයන් ගේ ආනයන බදු අඩුකිරීම, ආනයන බොහොමයකම, ආනයන බලපත්‍ර ගාස්තු අහෝසි කිරීම සහ තීරුබදු අය කළ යුතු භාණ්ඩයන් ගේ වටිනාකම අඩුවීමය. දේශීය භාණ්ඩ බදු මගින් අයභාරය වැඩි කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ගයන් හේතු කොට ගෙන තවත් රුපි. දශ ලක්ෂ 39 ක් ලැබුණි. මින් විශාල කොටසක් ම, ( රුපි. දශ ලක්ෂ 29 ) ක් ලැබුනේ දුම්කොළ බදුවලිනි.

1967/68 දී මුළු සම්මත වියදම වශයෙන් රුපි. දශ ලක්ෂ 2,900. 6 ක්ව තාවකාලිකව ඇස්තමේන්තු කොට තිබිණ. මෙය මුල් ඇස්තමේන්තුවට වඩා රුපි. දශ ලක්ෂ 38.9 කින් වැඩි ය. ඉකුත් දස වසරේ සියයට 5.9 ක වැඩිවීම හා සසඳන කල, මුළු වියදමෙහි සියයට 12.1 ක වැඩිවීමක් ඇති විය. ප්‍රවර්තන වියදම මුළු සම්මත වියදමෙන් සියයට 72.7 ක් වූ අතර, ඉතිරි කොටස ප්‍රාග්ධන වියදම් විය. ප්‍රාග්ධන වියදමෙහි වාර්ෂික සාමාන්‍යය ඉකුත් දස වසර ඉක්මවා සියයට 8 කින් වැඩි විය. වර්තන වියදම වසරක් පාසා සියයට 6.6 කින් වැඩි විය. රජයේ ප්‍රාග්ධන වියදම රුපි. දශ ලක්ෂ 793 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් වැඩි කොටසක් ම, කෘෂිකාර්මික අංශය වෙතත්, ( සියයට 32.2 ක්) සමාජයීය පදනම් ව්‍යුහයේ ප්‍රතිපාදනය සඳහාත් ( සියයට 24.7 ක් ) යොදවන ලදී. රුපි. දශ ලක්ෂ 108.4 ක් ව්‍යවසායයන් සඳහා වූ ප්‍රාග්ධන වියදම වශයෙන් මෙම එකතුවට අඩංගු කොට ඇත.

1968 දී, ප්‍රාග්ධන වියදම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 90 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේ දී මෙන්ම 1967/68 වර්ෂයේදී ද සම්මත ප්‍රාග්ධන වියදම් පහත වැටුණි. එම පහල යාම රු. දශ ලක්ෂ 124.1 කි. මෙසේ ප්‍රාග්ධන වියදම් ඉහල ගියේ සැලසුම් ක්‍රියාත්මක කිරීම දියුණු කිරීමේ හේතුවෙන් ඌන වියදම් ඉකුත් වසරේ පැවති සියයට 21 සිට සියයට 14.8 දක්වා පහල යාම නිසාය.

මුළු වර්තන වියදමෙහි, පැවැරුම් ගෙවීම් 1967/68 දී (ආහාර පිහිටාධාර, රාජ්‍ය ණයෙහි පොළිය, විශ්‍රාම වැටුප් යනාදිය ) මුළු එකතුවෙන් සියයට 35.6 ක් විය. දළ ආහාර පිහිටාධාරය ( මෙය නම්, රුපි. දශ ලක්ෂ 295.9 ක් වූ පාරිභෝගික පිහිටාධාරයෙන් ( ආනයන කළ සහල් ) සහ රුපි. දශ ලක්ෂ 236.1 ක් වූ නිෂ්පාදන හා පාරිභෝගික පිහිටාධාරයෙන් ( මෙරට සහල් ) සමන්විත වෙයි ) රුපි. දශ ලක්ෂ 465.5 සිට රුපි. දශ ලක්ෂ 589.4 දක්වා සීඝ්‍ර වැඩිවීමක් දැක්විය. සීනි, පිටි සහ වෙනත් භාණ්ඩයන් කිහිපයක අලෙවියෙන් ලබන ලාභයන් සඳහා වූ ගැලපීම් වලට ඉඩ තැබීමෙන් පසුව ශුද්ධ පිහිටාධාරය රුපි. දශ ලක්ෂ 104.5 කින් ( හෙවත් සියයට 54.1 කින් ) වැඩි විය.

වර්ෂය තුළ දී ආනයනය කළ සහල් ප්‍රමාණය පහත වැටුන නමුත්, ආනයන කරනු ලැබූ සහල් ටොන් එකක මිල රුපි. 654 සිට රුපි. 988 ක් දක්වා එනම්, සියයට 51 කින් සීඝ්‍ර ලෙස වැඩි විය. වී පිළිබඳ වූ සහතික මිලෙහි ද වැඩිවීමක් සිදුවිය. වී බුසලක් රු. 12 සිට රු. 14 දක්වා වැඩි විය. සලාක ක්‍රමය යටතේ දෙනු ලැබූ දේශීය සහල් ප්‍රමාණය ටොන් 2,38,159 සිට ටොන් 2,10,000 දක්වා සියයට 12 කින් අඩු වී ගිය නමුදු, වැඩි ප්‍රතිශතයකින් ( සියයට 16.6 කින් ) මිල ඉහළ නැඟිනි. අධ්‍යාපනය, සෞඛ්‍ය, ආහාර යනාදිය සම්බන්ධයෙන් සමාජයීය ශුභ සාධන වැඩ පිළිවෙලවල් පවත්වාගෙන යන ලංකාව වැනි රටක ජනගහනයෙහි වර්ධනයත් සමගම වර්තන වියදම් ඉහළයාම නොවැලැක්විය හැකි බව අවධාරණයෙන් සඳහන් කිරීම අවශ්‍ය නැති තරම්ය.

අයවැය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම පෙන්වනුයේ, බදු අය කිරීම සහ රාජ්‍ය ණය සඳහා ඇති ඉඩකඩට වඩා රජයේ කටයුතු විසින් ජාතික නිමැයුමෙන් උරා ගනු ලබන ප්‍රමාණය යයි. පෞද්ගලික පාරිභෝජනයෙහි සංකෝචනය නොවුන සම්පත් මාර්ග රජය විසින් උපයෝගී කර ගැනීම ප්‍රසාරණාත්මක බලවේගයන් තර කරනු ඇත. මුළු අය–වැය හිඟය, එනම්, ණය දීමේ සහ ණය ගැනීම් ඇති වන ශුද්ධ ලැබුම් ( හෝ ගෙවුම් ) සහ විදේශීය දීමනා අඩු කිරීමෙන් සිදුවන මුදල් ශේෂයන් ගේ සංඛ්‍යාව රුපියල් දශ ලක්ෂ 715.7 ක් විය. මෙය මෙතෙක් වාර්තාගත වී ඇති ඉහලම සංඛ්‍යාව විය. වර්තන සහ ප්‍රාග්ධන වියදමෙහි සහ අත්තිකාරම් ගිණුම් කටයුතුවල වැඩිවීම එකතු කර ගත් ආදයම් ප්‍රමාණය වැඩිවීම නිසා එක්තරා ප්‍රමාණයකට මඟහැරී ගිය නමුදු, එය ශුද්ධ හිඟය අළුත් මට්ටමක් කරා ඉහල නැංවීමේ හැකියාවක් ඇති කළේ ය. 1 (2) සංඛ්‍යා සටහනෙහි මෙම හිඟය පියවීම සඳහා මුදල් යෙදවුනු අයුරු පෙන්වයි.

දේශීය වෙළෙඳ පොලෙහි බැංකු ක්‍රමයෙන් ( ප්‍රධාන වශයෙන් ම, මහ බැංකුව වෙතින් ) ලබාගත් ණය මුදල් අයවැය හිඟය පියවීමේ ප්‍රධාන මාර්ගය වූ අතර, එසේ පියවා ගත් ප්‍රමාණය ශුද්ධ හිඟයෙන් සියයට 42 කට කිට්ටු විය. 1968 සැප්තැම්බරයේ දී අනුමත කළ මුළු සීමාව වූ රුපියල් දශ ලක්ෂ 1,750 න් සියයට 91 ක් ම මහ බැංකුව සතු වූ භාණ්ඩාගාර බිල්පත් ය. වෙළෙඳ පොලෙහි බැංකු නොවන මාර්ගවලින් ණය මුදල් ලබා ගැනීම පෞද්ගලික අංශයෙහි ද්‍රව්‍යශීලතාවය අඩු කිරීමට හේතු වෙයි. අයවැය හිඟය පියවීම සඳහා ගත් ණය මුදල් වලින් සියයට 35 මෙකී ක්‍රමය යටතේ ගත් හෙයින් අඩුම ප්‍රසාරණයක් මෙමගින් සලසා දෙයි. යෝජනාක්‍රම ණය සහ භාණ්ඩ ණය ස්වරූපයෙන්, විදේශීය රටවලින් ණය මුදල් ලබා ගැනීම වස් පිළිසරණ සෙවීමට රජයට බොහෝදුරටම සිදු විය. එය ශුද්ධ අය–වැය හිඟයෙන් සියයට 26 ක ප්‍රමාණයක් විය.

## සංඛ්‍යා සටහන 1 (2)

## 1963/64 සිට 1967/68 දක්වා හිඟය පියවීම

රුපියල් දශ ලක්ෂ

| මූලය | 1963–64 | 1964–65 | 1965–66 | 1966–67 | 1967–68* |
|---|---|---|---|---|---|
| 1. බැංකු නොවන මාර්ගවලින් (මුළු) ... | 301.1 | 393.2 | 486.1 | 577.9 | 448.3 |
| (අ) දේශීය බැංකු නොවන මාර්ගවලින් ... | —1.9 | 50.3 | 112.2 | 72.3 | 9.8 |
| (ආ) බැංකු නොවන දේශීය වෙළෙඳපොල මාර්ග වලින් ණය ගැනීම ... | 207.6 | 243.2 | 255.9 | 297.0 | 248.3 |
| (ඇ) විදේශීය ණය හා දීමනා ... | 95.4 | 99.7 | 118.0 | 208.6 | 190.2 |
| 2. බැංකු ක්‍රමයෙන් ලබාගත් දේශීය ණය ... | 115.2 | 17.7 | 162.3 | 51.3 | 303.5 |
| 3. රජයේ මුදල් ශේෂ හා ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් උපයෝගීකොට ගැනීම ... | | | | | |
| (අ) මුදල් ශේෂ ... | 45.4 | 19.5 | — 47.2 | 21.5 | —48.4 |
| (ආ) ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ... | — | — | — 35.2 | — 43.9 | 12.3 |
| 4. මුළු ශුද්ධ හිඟය ... ... | 461.7 | 430.4 | 566.0 | 606.8 | 715.7 |
| 5. එ. ජ. ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලෙහි ... වෙනස්වීම් සඳහා ගැලපිළි ... | 2.3 | —2.5 | 42.5 | 27.2 | — |
| 6. රාජ්‍ය මුදල් පරිහරණයේ ශුද්ධ ප්‍රසාරණාත්මක බල පෑම (2+3+5) ... | 162.9 | 34.7 | 122.4 | 56.1 | 267.4 |

* තාවකාලිකයි

මෙකී මුදල් යෙදවීමේ ක්‍රමය ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති නොකරන්නේ, එය ආනයනයන් මගින් රටෙහි මූර්ත සම්පත් ප්‍රමාණය වැඩි කරන හෙයිනි. ප්‍රතිපාර්ශ්වීය අරමුදල් පාවිච්චි කිරීම සහ මුදල් ශේෂයන් හැර ගැනීම්, ඒවා ප්‍රයෝජනයට ගන්නා විට දී ප්‍රසාරණාත්මක වෙයි. ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වලින්, දැනටමත් ලැබී ඇති භාණ්ඩයන් සඳහා ලංකාවෙන් අය විය යුතු ප්‍රමාණය පෙන්නුම් කරයි. භාණ්ඩයන් පැමිණිවිටදී, භාණ්ඩ සඳහා වූ මුදල් ප්‍රතිපාර්ශ්වීය අරමුදලට බැර කරන බැවින්, අවධමනීය තත්වයක් උද්ගත වෙයි. නමුත්, මෙම අරමුදල් ප්‍රයෝජනයට ගත් විට ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති වෙයි.

සමස්තයක් වශයෙන් ගත් විට, රජයේ මුදල් කටයුතු මගින් සිදුවුන ප්‍රසාරණාත්මක බලපෑම ඉකුත් වර්ෂයට වඩා, 1967/68 මුදල් වර්ෂයේ දී බොහෝ සෙයින් ම ( රුපි. දශ ලක්ෂ 211 කින් ) වැඩිවිය. විදේශීය රටවලින් ලැබුන ආධාර සහ වෙළෙඳ පොලෙහි දේශීය වශයෙන් බැංකු නොවන මූලයන් මගින් ලබාගත් ණය, ඉකුත් වර්ෂයෙහි වූ මට්ටමට වඩා අඩු විය. සුරැකුම්පත් මාධ්‍යය කොට ගෙන රජයේ මුදල් කටයුතු සඳහා මුදල් විශාල ප්‍රමාණයක් සැපැයීම පිණිස, බැංකුව නොවන මූලයන් ධෛර්යමත් කරවීමෙහි ලා මුදල් මණ්ඩලයෙහි උපදේශයන් වූ දීර්ඝ කාලීන ( අවුරුදු 21 – 25 දක්වා ) සුරැකුම් පත් සඳහා වූ පොළී ප්‍රමාණය සියයට 4½ සිට සියයට 5½ දක්වා වැඩි කිරීම රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. රජයේ සුරැකුම්පත් සඳහා යෙදවූ ප්‍රමාණයෙහි පහළ වැටීමක් සිදුවීමට හේතු වී ඇත්තේ, පෞද්ගලික අංශයෙහි කර්මාන්ත සහ වෙනත් ආයෝජන මාර්ගයන් ලබා ගැනීමට හැකි වූ හෙයින් විය හැකි ය. මෙය, විදේශීය ණය සහ දීමනා ප්‍රමාණයෙහි අඩුවීම හා එක්වුණු කල රජය විසින් මහ බැංකුව වෙතින් ලබා ගත් ණය මුදල් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 176.4 ක් වීම, එහි ප්‍රතිඵලයක් බවට පත් විය.

අයවැය ලේඛනය සකස් කරන අවස්ථාවේදී 1967/68 සඳහා අපේක්ෂිත අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 768.1 ක් වූ අතර, ඇස්තමේන්තු කරන ලද ශුද්ධ මුදල් හිඟය ( නිදන් අර මුදලේ දයක මුදල් සහ රාජ්‍ය ණය සෘජු ගෙවීම් සඳහා ගැලපීමෙන් පසු ) රුපියල් දශ ලක්ෂ 642.5 ක් විය. පහත දැක්වෙන සංඛ්‍යා සටහනින්, 1967/68 සඳහා වූ නියම ( තාවකාලික ) ඇස්තමේන්තු සමග මුල් ඇස්තමේන්තුවල සංඛ්‍යා සසඳා ඇත.

අපේක්ෂිත ශුද්ධ මුදල් හිඟය බොහෝ දුරටම, ප්‍රසාරණාත්මක නොවන මාර්ගයන්ගෙන් පියවීමට බලාපොරොත්තු වූ අතර, නොපිය වූ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 96.1 ප්‍රසාරණාත්මක මාර්ගයක් වන බැංකු මුදල් වලින් පියවිය යුතු විය. කෙසේ වුවද, ප්‍රසාරණාත්මක නොවන මාර්ගයන්ගෙන් නොපියවී තිබුණු රුපියල් දශ ලක්ෂ 98.1 ක හිඟයක්දවූ අතර, ශුද්ධ මුදල් හිඟයේ ප්‍රමාණයද රුපියල් දශ ලක්ෂ 73.2 කින් ඉහළ ගියේ ය. මේ අනුව ප්‍රසාරණාත්මක මාර්ගයන්ගෙන් ලබා ගත් මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 171.3 කින් ඉහළ ගියේය.

## 1– 3 වැනි සංඛ්‍යා සටහන
## 1967/68 දී ශුඩ මුදල් හිඟය පියවීම

( එනම් නිදන් අරමුදලේ දයක මුදල් සහ සෘජු රාජ්‍ය ණය ආපසු ගෙවීම් සහ විශේෂ ගෙවීම් හැර අයවැය හිඟය )

රුපියල් දශ ලක්ෂ

| මූලය | මුලින් (අපේක්ෂිත) | නියම (තාවකාලික) | අතිරික්තය හෝ හිඟය(-) |
|---|---|---|---|
| 1. විදේශීය මුදල් (ද්‍රව්‍ය සහ සැලසුම් ආධාර) ... ... | 224.4 | 190.2 | –34.2 |
| 2. දේශීය ණය | | | |
| (අ) බැංකු නොවන මූලයන්ගෙන් වෙළඳ පොල ණය ගැනුම් | 275.0 | 248.3 | –26.7 |
| (ආ) වෙළඳ පොල නොවන ණය ගැනුම් ... | 47.0 | 9.8 | –37.2 |
| 3. එ ක තු ව ... ... ... ... ... ... | 546.4 | 448.3 | –98.1 |
| 4. ශුද්ධ මුදල් හිඟය ... ... ... ... ... | 642.5 | 715.7 | + 73.2 |
| 5. බැංකුවෙන් ගත් ණය මුදල් (4—3) ... ... ... | 96.1 | 267.4 | 171.3 |

1967/68 අය–වැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු ආදයම් සහ වියදම් ව්‍යුහය වෙනසකට භාජන කළ වැදගත් තීරණයන් දෙකක් ඇති විය. එකක් නම්, 1967 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල අවප්‍රමාණය කිරීමය. අනික විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයක් ඇති කිරීමය. අවප්‍රමාණයෙහි බලපෑම අඩු කිරීම පිණිස සමහර ගණයන්හි සේවකයන්ට අතුරු දීමනාවක් ගෙවනු ලැබූ අතර, මේ හේතුවෙන් වර්තන වියදම් රුපි. දශ ලක්ෂ 65 කින් ඉහළ ගියේ ය.

ශුද්ධ මුදල් හිඟය අධිකවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ ආනයන කළ සහල් මිල තියුණු ලෙස ඉහළ යාම නිසා ශුද්ධ ආහාර පිහිටාධාරය රුපි. දශ ලක්ෂ 80 කින් ඉහළ යාමය. සමහර ශ්‍රෙණිවල රජයේ සේවකයන්ට 1967 නොවැම්බර් මාසයේ දී අවප්‍රමාණයට අමතරව අතුරු දීමනාවක් දීමේ හේතුවෙන් වර්තන වියදම රුපි. දශ ලක්ෂ 65 කින් ඉහළ ගියේ ය. 1967/68 තුළ දී බැංකු ක්‍රමය මගින් දරනු ලැබූ රුපි. දශ ලක්ෂ 21.6 ක ආහාර ආනයන බිල්පත් ප්‍රමාණයක් රජය විසින් විසුම් ගැන්විය. වියදමෙහි මෙම ඉහළ යාම, අපේක්ෂිත සංඛ්‍යාවට වඩා රුපි. දශ ලක්ෂ 106.5 කින් ආදායම් වැඩිවීමෙන්, තරමක් දුරට හිලව් වී ගියේය.[1]

රජයේ මුදල් පරිහරණයෙන්, බැංකුවල ද්‍රවශීලතාවය වැඩි කිරීම නිසා මුදල් සැපයුම කෙරෙහි සෘජු ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති විය. එසේම මහජනයා අතට අතිරේක ක්‍රය ශක්තියක් පැවරීමෙන් සාමාන්‍ය මිල මට්ටම වෙතද බලපෑමක් ඇති කළේ ය. තවද, මෙමගින් ආනයනයන් වැඩියෙන් ගෙන්වීමෙන් ගෙවුම් ශේෂය වෙත ද පීඩනයක් ඇති කරනු ලැබීය.

රජයේ මූල්‍ය කටයුතුවලින් ඉස්මතු වන ශුද්ධ බලපෑම, ඒවා මැඩලන සාධක වන මූර්ත නිෂ්පාදිතයෙහි වර්ධනය හා විදේශීය බැංකු වත්කම්හි අඩුවීම සිදු නොවන්නට දැඩි මූල්‍ය ප්‍රසාරණයකට හේතු වන්නට ඉඩ තිබුණි.

1968/69 අය–වැය ලේඛනයෙහි ( 1968 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුව අනුමත කළ ) ශුද්ධ මුදල් හිඟය රුපියල් දශ ලක්ෂ 701.2 ක් වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම හිඟය බොහෝ දුරටම ප්‍රසාරණාත්මක නොවූ මාර්ගයන් ගෙන් සහ රුපි. දශ ලක්ෂ 11.5 කට පමණක් සීමාවූ බැංකු ණය ප්‍රමාණයකින් පියවීමට රජය බලාපොරොත්තු වේ. ඇස්තමේන්තු කළ ආදායම සහ බලාපොරොත්තු වන විදේශීය ආධාර අඩුවීමෙන් අය–වැය ලේඛනයේ ප්‍රසාරණාත්මක බලපෑම මෙයට වඩා විශාල වනු ඇත.

1968/69 අයවැය ලේඛනය මගින් දේශීය භාණ්ඩ බදු සම්බන්ධයෙන් වෙනස්කම් කිහිපයක් යෝජනා වුනි. බදු කොමිසම මගින් යෝජනා කරනු ලැබූ අනිකුත් බදු ප්‍රතිසංස්කරණයන් එක්වරම ක්‍රියාත්මක නොවනු ඇත.

1. අයවැය ලේඛනය සකස් කළ අවස්ථාවේ දී අපේක්ෂිත අයභාරය රුපියල් දශ ලක්ෂ 2,049.9 ක් විය.

1968/69 අය-වැය ලේඛනයෙහි ප්‍රසාරණාත්මක මාර්ගයන් ගෙන් පියවීමට බලාපොරොත්තු වන හිඟය රුපි. දශ ලක්ෂ 11 කට සීමාවී ඇත. මෙම සංඛ්‍යාව වැඩි වන ලකුණු පැවැතිය ද අවසාන ප්‍රතිඵලය රඳනු ඇත්තේ, අය-වැය පරිපාලනය සහ ආධාර වැඩ පිළිවෙලවල්වලින් ලැබෙන ලැබීම් මතය. අයබදු ක්‍රමය ඉහළ අනුපාතයන් ගෙන් සැකැසුනත්, ජාතික නිෂ්පාදිතයෙහි ඉහළ යාමෙන් ප්‍රමාණවත් ශේෂයක් ලබා ගෙන නැත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආදායම් වැඩිවීම, ග්‍රාමීය පලාත්වල සංකේන්ද්‍රණය වීම සහ මීට ඉහත දී අනුගමනය කළ ආදායම පුනර්ව්‍යාප්ති කිරීමේ ප්‍රතිපත්තියයි. මෙම අළුත් තත්වය නිසා, සම්පත් මෙහෙයවීමේ ක්‍රමය වෙනස්කිරීමට අවශ්‍ය වී ඇත.

ආදායමෙහි වර්ධන වේගය අනුව බදු පැණවිය හැකි සීමාව පුළුල් වේ. ලංකාව වැනි නොදියුණු රටකට සෘජු බදු කෙරෙහි විශාල ලෙස රැඳිය නොහැකි ය. මේ අතරම මූලික ආදායම් මාර්ගයක් වශයෙන් රේගු තීරු බදු මත බොහෝසේ රඳා සිටීමෙන් රාජ්‍ය ආදායමෙහි නම්‍යතාවය අඩු කිරීමට තුඩුදේ. ආනයනයන්ගේ වියදම සහ ප්‍රමාණික සීමාකිරීම් ඇතුළු අපනයනයන්ගේ මිල පහල වැටීම් මගින් රේගු තීරුබදු ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස සැලකීමේ වැදගත්කම අඩුවීමට ඉඩ ඇත. ඒ අතර ම, ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් රේගු බදු වෙත රැඳීම රජයේ ආදායමෙහි නම්‍යතාවය අඩු කිරීමට හේතු වේ. මේ අනුව, ආදායම් මාර්ගයක් වශයෙන් පිරිවැටුම් බද්ද වැදගත් වෙමින් පවතී. වියදම් සම්බන්ධයෙන් බදු පැනවීම අවශ්‍ය වන්නේ, වියදම් කරන අවස්ථාවේ දී වැඩි වූ ආදායම්වලින් කොටසක් උරා ගැනීමට පමණක් නොව, වියදම් ව්‍යුහය තුලින් නිදහස් වෙළෙඳ පොලෙහි බලවේගයන්ට සම්පත් වෙන් කිරීමේ ප්‍රධාන කාර්යය සිදු කිරීමට ඉඩ හැරීමයි. වියදම් සම්බන්ධයෙන් පැනවෙන බදු හේතු කොට ගෙන ඉතිරි කිරීම් වැඩි වී ආර්ථික වර්ධනයක් ඇති වේ. පාරිභෝජනය අඩු කිරීමෙන් ඉතිරි කරන ප්‍රමාණය වෙනුවෙන් ආදායමක් ( පොළිය) ඉපැයීමෙන්, පාරිභෝගිකයෙකුට බදු ගෙවීම කල් හැරීමට පිළිවන. මෙවැනි බදු කුඩා ඉතිරි කරන්නන් වෙනුවෙන් අසාධාරණ වූ අතර, ඉහළ ඉතිරි කරන්නන්ට වාසි සහගත ය. මෙම ක්‍රියා මාර්ගයට අමතරව මිල උපයෝගීතාව හිතාමතා යොදගත් පාලන උපක්‍රමයක් වශයෙන්, සම්පත් මාර්ගයන් කාර්යක්ෂමව වෙන් කරනවා පමණක් නොව අතිරේක ඉල්ලුමෙන් කොටසක් උරා ගනිමින් එය පාලනය කරයි.

1965 දෙසැම්බර් මාසයේ දී කැබිනට් ක්‍රම සම්පාදක කාරක සභාව මගින් පත් කළ මිල ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාව 1966 දෙසැම්බර් මාසයේ දී නිකුත් කෙරුණි. රජයේ ව්‍යාපාරයන් විසින් අනුගමනය කැරෙන මිල ප්‍රතිපත්ති න් කමිටුව මගින් පරීක්ෂා කරන ලදී. සංස්ථාවන් බොහොමයකම භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් පැහැදිලි මිල ප්‍රතිපත්තියක් රජය විසින් අනුගමනය කර නැතැයි පෙනී ගියේ ය. යම් සංස්ථාවකට මිල තීරණය සම්බන්ධයෙන් බලයක් පැවතුන ද, මිල නියම කිරීමේ දී ආර්ථික වශයෙන් ඇති සුදුසුකමට වඩා දේශපාලනික කරුණු වැදගත් වී ඇත. අන් සමහර ව්‍යාපාරයන් සම්බන්ධයෙන් මිල ප්‍රතිපත්තියක් ඇති කිරීම වැලකී ඇත්තේ, මහජන සුබ සිද්ධිය පිළිබඳ සැලකිලිමත් වීම නිසා ය. සියළු ම බදු ගෙවීමෙන් පසු අවම ලාභාංශයක් ( රජයේ ණය ගැනීමේ අනුපාතයට වඩා අඩු වශයෙන් සියයට එකකට ඉහළින් ) ලැබිය හැකි වන පරිදි ය.

### (ii) පෞද්ගලික අංශය වෙත සැපයූ වාණිජ බැංකු ණය

1968 දී පෞද්ගලික අංශය වෙත සැපයූ බැංකු ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 291 ක විශාල වැඩිවීමක් පැවති අතර, 1967 දී එම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 105 ක් විය. මෙය මෑත වර්ෂවල දී වාර්තාගත වූ ඉහළ ම සංඛ්‍යාව වෙයි. අත්තිකාරම් ප්‍රමාණයෙහි ඉහළම වැඩිවීම ණය මුදල් ගණයෙහි විය. තවද, අයිරාවන්, ආනයන බිල්පත් සහ අපනයන බිල්පත් සම්බන්ධයෙන් ද සැලකිය යුතු වැඩිවීම් ඇතිවිණි. වර්ෂාවසානයෙහි දී බේරුම් කර නොතිබූ ණය සංඛ්‍යාවන්ගේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන්, හේතු වූයේ කාර්මික සහ වෙළඳ අංශයනට දෙන ලද අත්තිකාරම්ය. නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ බැංකු විසින් 1967/68 මහ කන්නය සහ 1968 යල කන්නය සඳහා දෙන ලද පරිමාව, කෘෂිකාර්මික ණය ක්ෂේත්‍රයෙහි මීට කලින් පැවති ණය ක්‍රමයයන් යටත් කිසිදු වර්ෂයක දෙන ලද ණය පරිමාවට වැඩි විය. කෘෂිකර්මික ණය ප්‍රමාණයෙහි ඉහළ යාම, නිමැවුමෙහි වූ ඉහළ යාම හා ගැලපුන අතර, ඒ සමගම ග්‍රාමීය අංශයෙහි ඉහළ ප්‍රමාණයක මුදල් බෙදී යාමක් ඇති වීය. පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෞද්ගලික අංශයට සැපයුනු වාණිජ බැංකු අත්තිකාරම් ප්‍රමාණය සම්පිණ්ඩනය කොට දක්වේ.

## සංඛ්‍යා සටහන 1—4

## පෞද්ගලික අංශය වෙත දෙන ලද වෙළඳ බැංකු අත්තිකාරම්

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂ | දෙසැම්බර් අවසානයට 1966 | 1967 | 1968 | වෙනස 1967/68 |
|---|---|---|---|---|
| (අ) එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂ* ... | 107.1 | 56.9 | 52.5 | — 4.4 |
| (ආ) දේශීය බිල්පත් ... ... | — | — | 0.1 | + 0.1 |
| (ඇ) ආනයන බිල්පත් ... ... | 35.3 | 55.6 | 89.4 | + 33.8 |
| (ඈ) අපනයන බිල්පත් ... ... | 52.4 | 53.4 | 80.2 | + 26.8 |
| (ඉ) අයිරාවන් ... ... | 391.9 | 418.9 | 497.8 | + 78.9 |
| (ඊ) ණය ... ... | 338.1 | 444.8 | 600.7 | + 155.9 |
| එකතුව ... | 924.8 | 1,029.6 | 1,320.6 | + 291.0 |

* මෙම වර්ගයට එකතු කිරීම සඳහා යවනු ලබන චෙක්පත්වලින් පෙනෙන අන්තර් බැංකු ණයෙන් ඉතා සුළුකොට සක් පමණක් ඇතුළත් වෙයි. එය ප්‍රධාන වශයෙන්, සහතික මිල ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා සමුපකාර ආයතනවලට දෙනු ලබන ඉතා කෙටි කාලීන අත්තිකාරම් සහ මිලට ගන්නා ලද ද්‍රව්‍ය වලින් සමන්විත වෙයි.

හිඟව පැවති බැංකු ණය පරිමාව 1968 දී උච්ච මට්ටමකට පත්විය. ණය රටාවෙහි දෘශ්‍යමාන වෙනස්කම් පැවතුනි. කාර්මික අවශ්‍යතාවන් වෙනුවෙන් දුන් අත්තිකාරම් පරිමාව අනුව සහ මුළු ණය ප්‍රමාණය අනුව සැලකියයුතු අන්දමින් ඉහල ගියේය. වාණිජ අත්තිකාරම් ගණයෙහි අපනයන වෙළඳ කටයුතු සඳහා පොහොර වැනි අන්තර් භාණ්ඩ සඳහා ද දුන් ණය ප්‍රමාණයෙහි වැඩිවීම් පැවතුනේය.

කෘෂිකාර්මික ණය ප්‍රසාරණය පිළිබඳව දැනටමත් සඳහන්ව ඇති අතර, පසුව එන කොටසක දී වඩාත් විස්තර සහිතව දැක්වේ. පාරිභෝජන කටයුතු සඳහා දුන් අත්තිකාරම්වල පහල වැටීමක් පැවැති අතර, මුළු අත්තිකාරම් අනුව මෙවායේ බර තැබීම් දෘෂ්‍යමාන ලෙස පහල වැටුණි.

### (iii) මුදල් සැපැයුම

1967 දෙසැම්බර් අවසානය සිට 1968 අවසානය දක්වා වූ කාලසීමාව තුළ දී මුදල් සැපැයුම රුපි. දශ ලක්ෂ 106 කින් හෙවත් සියයට 5.8 කින් වැඩි විය. මෙය ඉකුත් වර්ෂයේ දී සියයට 9 කින් ඉහළ ගියේ ය. කෙසේ වුවද, සාමාන්‍ය මාසික මට්ටමෙහි ඉහළයාම 1968 දී සියයට 6.9 ක් වූ අතර, 1967 දී සියයට 2.7 ක් විය. දළ ජාතික ආදයම සහ මුදල් සැපැයුම අතර අනුපාතය 1967 දී පැවැති සියයට 4.7 ක් ද, 1968 දී සියයට 5.3 දක්වා වැඩි වූ අතර, ඒ සමග ම ඉල්ලුම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතය 1967 දී පැවැති, 1.60 න්, 1968 දී 2.06 දක්වා ඉහළ ගියේ ය. 1967 අවසානයේ සිට 1968 දෙසැම්බර් අවසානය දක්වා මුදල් සැපැයුමෙහි වෙනස් වීම්වලට හේතු වූ කරුණු II (5) සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

මුදල් සැපැයුමෙහි වර්ධනය වෙත බල පෑ ප්‍රධාන සාධකය වූයේ රජයට සහ රජයේ සංස්ථාවන්ට සැපැයුනු ණය ප්‍රමාණය ප්‍රසාරණය වීමය. රජයට සැපැයුණු ණය ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 192 කින් ඉහළ ගියේ ය. එහෙත්, මෙම ඉහල යාමෙන් තුනෙන් එකකට කිට්ටු ප්‍රමාණයක්, ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සවරූපයෙන් වූ රජයේ මුදල් ශේෂයන් ගේ ඉහළ යාමෙන් හිලව් වී ගියේ ය.

## සංඛ්‍යා සටහන 1—(5)

## මුදල් සැපයුමෙහි වෙනස්වීම

### (1967 දෙසැම්බර් අවසානයෙහි සිට 1968 දෙසැම්බර් අවසානය දක්වා)

රුපියල් දශ ලක්ෂ.

| මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධකයන් | ප්‍රමාණය | |
|---|---|---|
| *1. ප්‍රසාරණාත්මක සාධක | | |
| (අ) පෞද්ගලික අංශයට සැපැයුනු වෙළෙඳ බැංකු ණය* ... ... | 173.5 | |
| (ආ) රජයේ සංස්ථාවලට සැපැයුනු වෙළෙඳ බැංකු ණය ... ... | 90.6 | |
| (ඇ) බැංකු ක්‍රමයෙන් රජයට සැපැයුණු ණය ... ... ... | 192.0 | |
| (ඈ) ගැලපිලි ... ... ... ... ... ... | 0.2 | 456.3 |
| 2. සංකෝචනාත්මක සාධක | | |
| (අ) විදේශීය බැංකු වත්කම් අඩුවීම (ශුද්ධ) ... ... ... | 115.7 | |
| (ආ) පෞද්ගලික අංශයෙහි කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතු වැඩිවීම* ... | 101.4 | |
| (ඇ) රජයේ සංස්ථාවල කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු වැඩිවීම ... ... | 23.2 | |
| (ඈ) වාණිජ බැංකුවල අනිකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම ... ... | 40.9 | |
| (ඉ) රජයේ මුදල් ශේෂයන් වැඩිවීම ... ... ... ... | 69.4 | |
| (ඊ) මහ බැංකුවේ අනිකුත් වගකීම් සහ ගිණුම් වැඩිවීම (ශුද්ධ) ... ... | 0.2 | 350.8 |
| 3. මුදල් සැපැයුමෙහි වැඩිවීම ... ... ... ... ... | | 105.6 |

* සමුපකාරයන් ඇතුළුව.

1(2) වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙන, අයවැය සංඛ්‍යා තොරතුරු මුදල් සැපැයුම් පිළිබඳ සංඛ්‍යාවන් හා සැසැඳීමෙන් පෙනී යන්නේ, රජයේ අයවැය කටයුතු හේතු කොට ගෙන, මහ බැංකුවෙන් විශාල ණය ප්‍රමාණයක් ලබා ගැනීමට හේතු වූ බවත්, මෙයින් විශාල කොටසක් වාණිජ බැංකු විසින් දරන ලද ආනයන බිල්පත් බේරුම් කිරීම පිණිස යොදගනු ලැබූ බවත් ය. මුදල් ශේෂයන් ආපසු ලබාගැනීමට හෝ මහ බැංකුවෙන් ණය ලබා ගැනීමකට හෝ හේතු වන හෙයින්, ආනයන බිල්පත් බේරුම්කිරීම ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරවන බව සැලකිය යුතුය. මේ ආකාරයෙන් ණය ලබා ගැනීම වාණිජ බැංකු ණය මගින් අයවැය හිඟය පියවීමකට හේතු වෙයි.1

පෞද්ගලික අංශයට සැපැයූ වෙළෙඳ බැංකු ණය ප්‍රමාණය ( රජයේ සංස්ථා හැර ) රුපි. දශ ලක්ෂ 174 කින් ඉහළ ගිය නමුදු, කාලීන සහ ඉතිරි කිරීම් තැන්පතු මගින් රුපි. දශ ලක්ෂ 101 කින් වැඩිවීමකින් සහ වාණිජ බැංකුවල ' අනෙක් ' වගකීම් ( ශුද්ධ) රුපි. දශ ලක්ෂ 41 කින් වැඩි වීමකින් බොහෝ සේ හිලව් වී ගියෙන්, පෞද්ගලික අංශයෙහි ශුද්ධ ප්‍රාසරණාත්මක බලපෑම රුපි. දශ ලක්ෂ 32 ක් විය. වාණිජ බැංකුවලින් ලබාගත් ණය ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 91 කින් වැඩි කිරීමෙන් රජයේ සංස්ථාවන් ප්‍රසාරණාත්මක බලපෑම කෙරෙහි විශාල ප්‍රමාණයකින් දයක වූ අතර, ඒවායේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 23 කින් ඉහළ යාමෙන් මෙය තරමක් දුරට හිලව් වී ගියේ ය.

ප්‍රසාරණාත්මක පීඩනයන් කෙරෙහි ආසන්න වශයෙන් රුපි. දශ ලක්ෂ 223 කින් පමණ දයක වූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් විසින් ජනිත කළ ප්‍රසාරණාත්මක බලවේගයන් රුපි. දශ ලක්ෂ 116 කින් විදේශීය බැංකු වත්කම් පහත වැටීම හේතු කොට ගෙන ඇති වූ සංකෝචනාත්මක බලපෑම් නිසා අඩු වී ගියේය.

---

1. අයහාරය සහ වියදම පිළිබඳ ඇස්තමේන්තු දක්වෙන රජයේ අයවැය ලේඛනයෙහි මෙම බිල්පත් රජයේ වියදමෙහි කොටසක් ලෙස නොදක්වා ඇති හෙයින්, බැංකු ක්‍රමය මගින් රජයේ හිඟය පියවීමේ මාර්ගයක් ලෙසින් දක්වා නොමැත. මේ හේතුවෙන් මෙම ණය ප්‍රමාණය ඉහළ ගිය වර්ෂයන් හි මුළු හිඟය පමණට අඩුවෙන් දක්වා ඇත. මේ අතර, එහි ප්‍රසාරණාත්මක බලපෑම සහ එවැනි ණය අඩු වූ වර්ෂ වල දී හිඟය පමණ ඉක්මවා දක්වා ඇත. මුදල් සැපැයුම පිළිබඳ විග්‍රහයේ දී මෙම ආනයන බිල්පත් සටහන් වී ඇත්තේ බැංකු ක්‍රමයෙන් රජයට සැපැයුන ණයෙහි කොටසක් වශයෙනි. බැංකුවෙහි වූ රාජ්‍ය ණය ප්‍රමාණයෙහි වෙනස්වීම් මගින් දේශීය ඉල්ලුම කෙරෙහි රජයේ විධිවිධානයන් ගේ බලපෑම පෙන්නුම් කළේ සුළු වශයෙනි. රජයේ අය–වැය ලේඛනය පිළිබඳ කොටසක, අය–වැය ක්‍රියාවලිය දක්වා ඇත.

## (ඇ) 1968 වර්ෂය තුළ විදේශීය ගෙවුම්

ගෙවුම් ශේෂ තත්ත්වය තවදුරටත් පීඩනයක පැවැති අතර, ඒ සමග ම ඉකුත් වර්ෂයට වඩා වෙළෙඳ අනුපාතය තියුණු පිරිහීමකට පත් විය. රුපියල් අනුව බලන විට මිල උපනතීන් සතුටුදායක වුවද, තේවල විදේශීය මිල, ඇත්ත වශයෙන් පහළ වැටුනේ ය.

දෘෂ්‍ය සහ අදෘෂ්‍ය යන අපනයන ඉපැයීම් දෙ වර්ගයම 1967 රුපි. දශ ලක්ෂ 1,912 න් රුපි. දශ ලක්ෂ 2,229 දක්වා සියයට 16.6 කින් ඉහළ ගියේ ය. ආනයනයන් මෙයට වඩා වේගයෙන් වැඩි වී 1967 දී රුපි. දශ ලක්ෂ 2,201 න් 1968 දී රුපි. දශ ලක්ෂ 2,575 දක්වා සියයට 17.0 කින් ඉහළ ගියේ ය. වර්තන ගිණුමෙහි මෙම ගනුදෙනු හේතුවෙන් ගෙවුම් ශේෂයෙහි ඇති වූ හිඟය ඉකුත් වර්ෂයන්හිදී වඩා රුපි. දශ ලක්ෂ 57 කින් වැඩි විය. 1(4) වැනි සංඛ්‍යා සටහනින් ගෙවුම් ශේෂ හිඟය පියවීමේ රීතීන් දැක්වේ :—

### සංඛ්‍යා සටහන 1—(6)

### ලංකාවේ ගෙවුම් ශේෂය 1963/1968

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 (අ) |
|---|---|---|---|---|---|---|
| 1. වෙළෙඳ භාණ්ඩ | | | | | | |
| අපනයන නැ. වි. ස. ... ... | 1,708 | 1,767 | 1,909 | 1,674 | 1,650 | 1,975 |
| ආනයන මි. ර. ගැ. ... ... | — 1,869 | — 1,960 | — 1,922 | — 2,018 | — 1,985 | 2,341 |
| වෙළෙඳ ශේෂය ... ... | — 161 | — 192 | — 13 | — 344 | — 335 | — 366 |
| 2. සේවා ... ... | — 20 | — 7 | 31 | 16 | 24 | — 3 |
| 3. සංක්‍රාම ගෙවුම් ... ... | 13 | 40 | 40 | 37 | 22 | 23 |
| 4. වර්තන ගිණුම් ශේෂය ... ... | — 168 | — 160 | 59 | — 290 | — 289 | — 346 |
| මුදල් ලබාගත් ක්‍රමය | | | | | | |
| 5. පෞද්ගලික ප්‍රාග්ධනය | | | | | | |
| (i) දිගු කාලීන ... ... | + 5 | + 1 | — 4 | — 16 | — 6 | — 12 |
| (ii) කෙටි කාලීන ... ... | — 5 | — 9 | — 18 | — 18 | + 8 | — 7 |
| 6. රජයේ හා බැංකු ප්‍රාග්ධනය (ආ) ... | | | | | | |
| (i) දිගු කාලීන විදේශීය වගකීම්වල (ශුද්ධ) වෙනස්වීම ... ... | + 75 | + 7 | + 36 | + 153 | + 167 | + 326 |
| (ii) කෙටි කාලීන විදේශීය වගකීම්වල (ශුද්ධ) වෙනස්වීම් ... ... | + 46 | + 59 | + 22 | + 71 | + 269 | + 174 |
| (iii) විදේශීය වත්කම්වල වෙනස්වීම් ... | + 42 | + 111 | — 89 | + 122 | — 131 | — 14 |
| (iv) අනෙකුත් ... ... | — | — | — | — 2 | — 6 | — 6 |
| 7. වැරදි සහ අත්හැරීම් ... ... | + 4 | — 8 | — 6 | — 16 | — 12 | — 25 |

(අ) තාවකාලිකයි.
(ආ) ධන ලකුණින් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම දැක්වේ.

දළ ජාතික නිෂ්පාදිතයෙහි ඉහළ යාමට වඩා වේගයකින්, ආනයනවල මුදල් අගය ඉහළ යාමට මූලික වශයෙන් හේතු වූයේ රුපියල අවප්‍රමාණ කිරීමය. 1968 දී පාරිභෝජනයෙහි ආනයන කොටස ඉකුත් වසරට වඩා වැඩි විය. පෞද්ගලික පාරිභෝජනයෙහි ආනයන සංගුණය 1967, තිබුණු 0.15 සිට 1968 දී 0.17 දක්වා ඉහළ ගිය අතර, ප්‍රාග්ධන සම්පාදනයෙහි ආනයන සංගුණය 1967 දී පැවැති 0.23 සිට 1968 දී 0.27 දක්වා ඉහළ ගියේ ය. අවප්‍රමාණයෙන් උද්ගත වූ මිල වැඩිවීම් හේතු කොට ගෙන ආනයනයන් කෙරෙහි වූ බැඳීම් වැඩි විය. ඉහළ යන ආනයන සංගුණයක් පවතින පරිසරයක, ගෙවුම් ශේෂයෙහි ඇති විෂමතාවන් නිසා එහි හිඟය විශාල නොවීම වැදගත් කරුණකි. මෙයට හේතු වූයේ අවප්‍රමාණයෙන් පසු, රුපියල් අනුව අපනයන ඉපැයීම් ඉහළ යාමය. අපනයනයන් රුපි. දශ ලක්ෂ 325 කින් ඉහළ ගියේ ය. එහෙත් ගෙවුම් ශේෂය අහිතකර විය. මෙම ඉහළ යාමෙහි සාධකයන් තුනක එනම්, මිල පරිමාව සහ වෙළෙඳ අනුපාතය — බලපෑම් සම්මිශ්‍රණය වී ඇත. මෙම සාධකයන් වෙළෙඳ ශේෂය කෙරෙහි මෙන්ම අපනයනයන් ගේ වැඩිවීම කෙරෙහි ද එකම ආකාරයකින් සහ එකම ප්‍රමාණයකින් බලපෑමක් ඇති කරතැයි සිතා ගැනීමෙන් මෙම, එකිනෙක සාධකයන්ට අපනයන ඉපැයීම් තුල සාමාන්‍යයෙන් හිමි කොටස සොයා ගත හැකි ය. අවප්‍රමාණයේ ප්‍රතිඵලයක් වශයෙන් තේවල විදේශීය මිල පහල වැටීම නිසා මිල ප්‍රතිඵලයක් සහ වෙළෙඳ

අනුපාත ප්‍රතිඵලයක් ඇති වූයේ යැයි සිතිය හැකි වන අතර, පරිමාව ඉහළ ගියේ තේ නිෂ්පාදනයට ම ආවේනික කරුණු අනුවය. තේ අපනයන පිරිමාව ඇත්ත වශයෙන් ම පහළ වැටුනු බව සඳහන් කළ යුතුය. රබර් මිල දී ගැනීමේ දී ප්‍රතිපාර්ශ්වීය ගිවිසුම් හේතු කොට ගෙන මුළු රබර් නිමැවුම අලෙවි කිරීම පිළිබඳ කිසිම ප්‍රශ්නයක් ඇති නොවේ. පොල් සහ පොල් ද්‍රව්‍යයන්ගේ පරිමා ප්‍රතිඵලයන්, අපනයන ඉපැයීම්වල අඩු බරතැබීමක් පමණක් වීය.

1968 සඳහා වූ විදේශීය විනිමය අය–වැය ලේඛනය, වි. වි. හි. ස. ක්‍රමය ආරම්භ කිරීමෙන් අනතුරුව සංශෝධනය කිරීමට සිදු විය. මුල් අය–වැය ලේඛනය පදනම් වූයේ බලාපොරොත්තු වූ රුපි. දශ ලක්ෂ 1,950 ක අපනයන ඉපැයීමක් මත වුවද, නියම අපනයන ඉපැයීම් ප්‍රමාණය ( ප්‍රති අපනයන් ඇතුළුව ) රුපි. දශ ලක්ෂ 2,025 ක් වීය. අපනයන ඉපැයීම් සම්බන්ධයෙන් වූ මෙම සතුටුදායක තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ අවප්‍රමාණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිල සියයට 20 කින් ඉහළ යාම හා පරිමාව සුළු වශයෙන් වැඩිවීම බව අවධාරණයෙන් කිව යුතුව ඇත.

මැයි මාසයේ දී ආනයන සැලැස්ම “ අ ” සහ “ ආ ” වර්ග දෙකකට සංශෝධනය කිරීමට සිදු වීය. මුල් ආනයන සැලැස්ම අනුව රුපි. දශ ලක්ෂ 2,234 ක සම්පත් ඒ සඳහා වෙන් කිරීමට බලාපොරොත්තු වීය. විනිමය ප්‍රතිසංස්කරණයන්ට අනතුරුව, මෙම වෙන්කිරීම් ඉහළ දැමූ අතර, 1968 දෙසැම්බර් අවසානය වන විට ‘ අ ’ ගණයේ භාණ්ඩයන් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍ර වටිනාකම රුපි. දශ ලක්ෂ 2,256 ක් වූ අතර, ‘ ආ ’ ගණයේ ආනයනයන් වෙනුවෙන් තවත් රුපි දශ ලක්ෂ 327 ක් වටිනා බලපත්‍ර නිකුත් කරනු ලැබ තිබිණි. ‘ අ ’ ගණයේ විවෘත පොදු බලපත්‍රය යටතේ වූ භාණ්ඩයන් වෙනුවෙන් විවෘත කළ ණයවර ලිපිවල වටිනාකම රුපි. දශ ලක්ෂ 308 ක් වීය.

මෙම ආනයන සැලැස්ම මුදල් කිරීම පිණිස පැවැති විදේශීය සම්පත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 2,811 ක් වීය. මෙයට රුපි. දශ ලක්ෂ 1,975 ක අපනයන ඉපැයීම් ද, රුපි. දශ ලක්ෂ 340 ක නිල ප්‍රාග්ධන ගලා ඊම් (මෙයට රුපි. දශ ලක්ෂ 295 ක්වූ ද්‍රව්‍යාධාර ණය, රුපි. දශ ලක්ෂ 42 දීමනා ද ඇතුළත් වේ ) රුපි. දශ ලක්ෂ 165 ක ප්‍රතිමිල දී ගැනීම හැර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කල ආපසු ගැනීම්, ප්‍රතිපාර්ශ්වීය ගනුදෙනුකරුවන්ට වූ ණයගැති භාවයේ ඉහළ යාම ( රුපි. දශ ලක්ෂ 42 ) සහ විදේශීය බැංකුවලින් ලබාගත් කෙටි කාලීන ණය ( රුපි. දශ ලක්ෂ 29 ) ඇතුළත් වුනි. විවෘත පොදු පලපත්‍ර යටතේ වූ භාණ්ඩ වෙනුවෙන් නිකුත් කළ මුළු බලපත්‍ර ප්‍රමාණය සහ විවෘත කළ ණයවර ලිපිවල වටිනාකමින් වර්ෂාවසානයේ දී ඉතිරිය රුපි. දශ ලක්ෂ 120 ක් විය.

කෙටි කාලීන ණය සඳහා මූලික මාර්ගය වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය. වර්ෂය තුළ දී රුපි. දශ ලක්ෂ 213 ක් ලබා ගන්නා ලදී. අපනයන ඉපැයීම්හි උච්ඡාවචනය නිසා වූ වන්දි ගෙවීමේ ක්‍රමය යටතේ රුපි. දශ ලක්ෂ 115 ක් ලබාගත් අතර, වි. වි. හි. ස. ක්‍රමය ඉදිරිපත් කිරීමට ඉතා මදකට කලින්, 1968 මැයි 5 වැනි ද එළඹි සම්පස්ථ ගිවිසුම යටතේ රුපි. දශ ලක්ෂ 98 ක්, ලබා ගන්නා ලදී. රුපි. දශ ලක්ෂ 48 ක ප්‍රතිමිලදී ගැනීම් නිසා ආපසු ගැනීම් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 165 ක් දක්වා අඩු කළ අතර, මෙය 1967 රුපි. දශ ලක්ෂ 105 ක් වූ ශුද්ධ ආපසු ගැනීම් ප්‍රමාණය හා සැසැඳේ.

නොයෙකුත් ණය ගැනීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් ආපසු ගැනීම් හේතු කොට ගෙන බාහිර වත්කම් ප්‍රමාණය ( ස්ටර්ලින් රන් පවුම් ණය සහ නිදන් අරමුදල් හැර ) 1967 දී පැවැති රුපි. දශ ලක්ෂ 407 සිට රුපි. දශ ලක්ෂ 417 .4 දක්වා 1968 දී ඉහළ ගියේය. කෙසේ වුවද, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය 1967 දී පැවැති රුපි. දශ ලක්ෂ 260.4 සිට රුපි. දශ ලක්ෂ 235.5 දක්වා 1968 දි පහළ වැටුනු නමුදු, වාණිජ බැංකුවල සහ රජයේ හා රජයේ නියෝජ්‍යත්ව සංචිතයන් හී විදේශීය ශේෂයන් පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 119.9 සිට රුපි. දශ ලක්ෂ 157.3 දක්වා සහ රුපි. දශ ලක්ෂ 68.3 සිට රුපි. දශ ලක්ෂ 70.2 දක්වා ඉහළ ගියේය. විනිමය ණය පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුව පිටරට බැංකු ගණනාවක් සමග සාකච්ඡා පවත්වන ලදී.

## (ආ) මිල

1968 දී සැපැයුම් තත්වය නිරපේක්ෂව ගෙන බලන කල 1967 දීට වඩා යහපත්වූ නමුදු, ඉල්ලුමට සාපේක්ෂව බලන කල සැපැයුමෙහි හිඟයන් පැවතුනි. අතිරික්ත ඉල්ලුමෙහි සමුච්චිත බලපෑම මිල කෙරෙහි බලපෑ ආකාරය කොළඹ පාරිභෝගික මිල දර්ශකය වර්ෂය තුළ දී සියයට 5.9 කින් ඉහළ යාමෙන් නිරූපනය වේ. මෙම දර්ශකය මිල ඉහළ යෑමෙහි යථා

තත්වය පිළිබිඹු නොකරන්නක් බව වෙනත් තැනක සඳහන් කොට ඇත. පාරිභෝගික මිල දර්ශකය අනුව බලන කල මිල පාලන විධිවිධාන, අත්‍යාවශ්‍ය ආහාර පාන සහ රෙදිපිළි සලාක කිරීම හා ඒ සඳහා පිහිටාධාර දීම මගින් මිල ඉහළ යෑම සීමා කරන ලදී.

කෙසේ වෙතත් උද්ධමනීය පීඩනය අර්ථ ක්‍රමයෙහි විවිධ අංශයන් වෙත හා විවිධ පාරිභෝගික පංතීන් කෙරෙහි බලපෑවේ එක සමානව නොවේ. සාමාන්‍යයෙන් බලතොත් ඉහළම මිල පීඩනය පැමිණියේ නිෂ්පාදිත භාණ්ඩයන් කෙරෙන්ය. පසුගිය වසර කිහිපය තිස්සේම ආනයන භාණ්ඩවල මිල ඉහළ යාමක් දක්විය. 1968 දී මේවායේ මිල වඩාත් වේගයෙන් ඉහළ ගියේ විනිමය අවප්‍රමාණය කිරීම හා ඉන් අනතුරු පැමිණි විනිමය සංශෝධන නිසාය. මෙකී වෙනස්කම්වලින්, ආනයන ආදේශ භාණ්ඩ වෙත සැපයුන ආරක්ෂණයෙහි මට්ටම වැඩි වූයෙන්, ඒවායේ මිල ද ඉහළ ගියේ ය. ඉල්ලුම නම්‍ය භාණ්ඩ සම්බන්ධයෙනුත්, එසේම විශාල තොග තබාගැනීම වාසිදයක නොවන හෙයින් සැපයුම ඉල්ලුමේ තරමටම ඉහල යාම සිදුවූ සමහර භාණ්ඩ සම්බන්ධයෙනුත් මිල ඉහළ යාමක්, විනිමය සංශෝධනවලින් අනතුරුව දක්නට ලැබුණි.

පාරිභෝජකයන්, ආයෝජකයන් හෝ රජය විසින්, තමන්ගේ ආදයම ඉහළයාම සහ ආදයම් ව්‍යාප්තිය ප්‍රයෝජනයට ගෙන, සාමාන්‍ය තත්වය යටතේ ලබාගත හැකි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක්, ඉහළ ගිය නිෂ්පාදිතයෙන් තමන්ට හිමිකර ගැනීමට උත්සාහ දරන විට, මුළු ඉල්ලුම කෙරෙහි සිදු වන පීඩනය අර්ථ ක්‍රමයෙහි උද්ධමනීය ප්‍රවනතාවයන් ඇති කරන අතර, ඒවායේ සමුච්චිත බලපෑම මගින් උද්ධමන පරතරය පුළුල් කෙරෙනු ඇත.

මිල වැඩිවීම කෙරෙහි පාරිභෝගිකයන් සහ ව්‍යාපාරිකයන් ප්‍රතික්‍රියා දක්වන්නේ වෙනස් අයුරින් ය. උද්ධමනය විසින් ඔවුනගේ ජීවන මට්ටම කෙරෙහි සිදු කරන ලද අහිතකර බලපෑම් මග හරවා ගැනීමට වැටුප් උපයන්නන් විසින් ඔවුන්ගේ වැටුප් ප්‍රමාණයෙහි වැඩිවීමක් ඉල්ලුම් කරයි. වැටුප් වැඩිවීම්වලට ගැලපෙන පරිදි, ඵලදයීතාවයෙහි ද වැඩිවීම සිදුවිය යුතුය. එසේ නොවුවහොත්, අමතර වියදම් හැකියාව හේතු කොට ගෙන තවදුරටත් මිල ඉහළ යා හැකිය.

විශ්වාසය තැබිය හැකි දර්ශකයක් නොමැති හෙයින්, මුල්‍ය ප්‍රසාරණයෙහි බලපෑම නියමාකාරයෙන් මැනිය නොහැකිය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය සියයට 5.9 කින් ඉහළ ගිය බැව් මීට ඉහත සඳහන් කරන ලදී. ජාතික ආදයමෙහි ගිණුම් සඳහා පාවිච්චි කරනු ලබන මිල අවපාතිකය සියයට 11 කින් ඉහළ ගොස් ඇත. අතිරික්ත ඉල්ලුම තෘප්තිමත් කිරීම සඳහා දේශීය නිමැයුමෙහි සමානුපාතික වැඩිවීමක් හෝ එම ප්‍රමාණයෙන්ම ආනයනයන් වැඩිවීමක් සිදු නොවන තෙක්, සඵල ඉල්ලුමෙහි තෘප්තිමත් නොවීමත් සමග සැපැයුමෙහි හිඟයක් පැවැත්ම මිල වැඩිවීමට හේතු වන්නේය. 1968 දී කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත අංශයන්හි නිමැයුමෙහි වර්ධනය විශිෂ්ඨ විය. එහෙත් සමස්ථ ඉල්ලුම අති විශාල වූයෙන්, මෙම වැඩිවීම මිල ඉහලයාම වලක්වාලීමේ ලා ප්‍රමාණවත් නොවිය. එහෙයින්, පාරිභෝජනය සහ ඇතැම් විට, ආයෝජන ද සීමා නොකළහොත්, මුල්‍ය ප්‍රසාරණය, මිල කෙරෙහි පීඩනයක් සිදු කරනු ඇත. නමුත්, වර්ධනය වන අර්ථ ක්‍රමයකට ආයෝජනය අඩු කිරීම හිතකර නොවන පියවරක් හෙයින් සමස්ථ ඉල්ලුමට සරිලන සමානුපාතිකව මූර්ත නිෂ්පාදිතයෙහි වැඩිවීමක් සිදුවන තෙක්, මුල්‍ය සහ රාජ්‍ය මුල්‍ය අංශයන්හි විකල්ප විධිවිධාන සැලැසිය යුතු වනු ඇත.

### (2). අර්ථ ක්‍රමයෙහි තෝරාගත් අංශයන් පිළිබඳ සමීක්ෂණය

#### (අ) කෘෂිකර්මය

1968 දී ජාතික ආදයම කෙරෙහි කෘෂිකාර්මික අංශයේ සහභාගිත්වය තවදුරටත් උසස් මට්ටමක පැවතුණි මෙම අංශයෙහි වර්ධන අනුපාතය 1963/66 දක්වා දළ දෙශීය නිෂ්පාදිතයට වඩා පහල මට්ටමක පැවතුනු. අතර 1967/68 දී එය දළ දේශීය නිෂ්පාදිතයෙන් උද්ගත කල වර්ධන අනුපාතයට ඉතාමත් ඉහලින් පිහිටියේය.

විදේශීය විනිමය ලබා දෙන ප්‍රධාන අපනයනවල වර්ධන වේගය පහලයාම තියුණු සැල කිල්ලට භාජනය විය යුතු කරුණකි. ඉකුත් වර්ෂ අට තුළ දී මෙම වර්ධනය වීමේ සංයුක්ත වේගය ඉහල ගියේ 1% ටත් වඩා අඩුවෙනි. මිල පහත වැටීම හේතු කොට ගෙන මෙම සම්ප්‍රදයික අපනයන සම්බන්ධයෙන් විශේෂ වූ ගැටළු මතු වෙයි. රබර්වල ඵලදයීතාවය වැඩි කිරීම හා වියදම් අඩු කිරීම සඳහා සාමුහික පරීක්ෂණ කණ්ඩායම් පිහිටුවීම, හෝ තේ අලෙවිය සඳහා සාමුහික ක්‍රියා පිළිවෙත් හා පොල් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා අලෙවි කිරීම

සම්බන්ධයෙන්, පොල් නිෂ්පාදන රටවල් වල ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවීම, මෙම මිල පහළ වැටීමේ උපනතිය මැඩලීම අරමුණු කොට ගෙන නිෂ්පාදක රටවල් විසින් ගෙන ඇති සාමූහික ප්‍රයත්නයන්ගෙන් සමහරකි. මෙම නිෂ්පාදිතයන් බොහෝ සෙයින්ම, අලෙවි කිරීම සම්ප්‍රදායික මාර්ගයක් තුලින් සිදු කරනු ලබන අතර, අළුත් වෙළෙඳ පොළවල් සොයා ගැනීමෙහි සැලකිය යුතු දියුණුවක් ලබා නොමැත. ආනයන බද්ද හා කෘත්‍රිම රබර් වැනි භාණ්ඩ විසින් '' අල්ලා ගනු ලැබූ වෙළෙඳ පොලවල් '' වැනි ආනයන ප්‍රසාරණයට ඇති බාධක ඉවත් කිරීම සඳහා පාරිභෝගික මෙන්ම නිෂ්පාදක රටවල් විසින් ජාත්‍යන්තර වශයෙන් ක්‍රියා මාර්ග ගත යුතුව ඇත.

දේශීය පාරිභෝජන සඳහා වන කෘෂිකාර්මික නිෂ්පාදන අංශයෙහි ගනු ලැබූ ආර්ථික ප්‍රතිපත්ති ග්‍රාමීය අංශය වෙත වඩවඩාත් යොමු වෙමින් පැවතුනි. වඩා යහපත්, වඩා වාරිමාර්ග පහසුකම්, ගංවතුර පාලනය, සහ ගොවිජන ව්‍යුහයෙහි දියුණුවක් ඇති කිරීම සඳහා 1968 දී රජය කළ ආයෝජනය රුපි. දශ ලක්ෂ 254.9 ක් විය. මෙය චනාහී ඉකුත් වර්ෂයට වඩා සියයට 43 කින් වූ වැඩිවීමකි. වඩාත් යහපත් ආදායම් ව්‍යාප්තියක් ලබා ගන්නා අතරම, කෘෂිකර්මයෙහි ආනයන ආදේශණ ප්‍රතිපත්තියක් කිරීම සඳහා, ආර්ථිකයෙහි ග්‍රාමීය කෘෂිකාර්මික අංශය දිරිගැන්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. 1966 වර්ෂයේ සිට ආනයනය කළ සහල් ප්‍රමාණය පහළ වැටුණි. 1966 දී ආනයනය කළ ටොන් 4,94,000 1967 සහ 1968 වර්ෂයන් හිදී පිළිවෙලින් ටොන් 2,81,000 සහ ටොන් 344,000 ක් දක්වා පහළ වැටිණි. අවාසනාවකට මෙන්, සහල් මිල සියයට 57 කින් තියුණු ලෙස වැඩිවීම නිසා ආනයනය කළ සහල් ප්‍රමාණය සියයට 10 කින් අඩුවීමෙන් ලද ඉතිරිය පමණටත් වඩා හිලව් වී ගියේ ය.

කෘෂිකාර්මික වැඩ පිළිවෙල ප්‍රධාන වශයෙන්ම යොමු වූයේ අපනයන සඳහා නොවන සහල් සහ අතිරේක ආහාර බෝග නිෂ්පාදනයන්ගෙන් සවයංපෝෂිත වීම සඳහා ය. ඉකුත් වර්ෂයේ දී බුසල් දශ ලක්ෂ 55.1 ක්වූ වී නිෂ්පාදනය (එය සහල් ටොන් 7,69,000 කට සමානය ) හා සසඳන කල්හි මෙම වර්ෂයේදී වී නිෂ්පාදනය බුසල් දශ ලක්ෂ 64.6 ( එය ටොන් 900,000 කට සමානය ) වීමෙන් උච්චතම මට්ටමක් කරා පැමිණියේය.

උසස් ගණයේ කෘෂිකාර්මික යෙදවුම් මිල පිළිබඳ දිරිගැන්වීම් සහ ආයතනික ණයවල සවරූපයෙන් ගොවියා ධෛර්යමත් කිරීමෙන්, නිමැයුමෙහි කැපී පෙනෙන වැඩිවීමක් ඇති විනි. 1968 දී රසායනික පොහොර පාරිභෝජනය ටොන් 30,000 කින් වැඩි වීමට හේතු වූයේ රසායනික පොහොර පිහිටාධාරය ක්‍රියාත්මක කරවීම සහ ණය පහසුකමය. 1967 නොවැම්බර් මාසයේ දී අවප්‍රමාණ කිරීමෙන් පසුව වී බුසලක සහතික මිල රුපි. 12 සිට රුපි. 14 දක්වා වැඩි කිරීම, නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා පෙළඹවීමක් සැපයුවා පමණක් නොව, එම නිෂ්පාදන සඳහා වඩාත් පහසු වෙළෙඳ පළක් ද ලබා දුනි. 1968 දී විවෘත වෙළෙඳ පොලෙහි මිල, සහතික මිලට වඩා ඉහලින් විය. සහතික මිල ක්‍රමය යටතේ සහල් සේරුවක සාමාන්‍ය මිල සත 90 ක් වූ නමුත්, පාරිභෝජන මධ්‍යස්ථානයන්හි විවට වෙළෙඳ පොලේ සාමාන්‍ය මිල ඇතැම් කාලවල දී මෙයට වඩා අධික විය. දේශීය නිෂ්පාදනය තියුණු ලෙස වැඩි වුවද, විවෘත වෙළෙඳ පොලෙහි සාමාන්‍ය මිල සහතික මිලට වඩා ඉහලින් පැවැතියේ, ප්‍රධාන වශයෙන් ( තොග ද සහිතව ) සියළුම ධාන්‍ය වර්ගවල සැපයුම තවමත් ඉල්ලුමට වඩා ටොන් 1,94,000 කින් පමණ අඩු වී තිබීමය.

සහල් කෙරෙහිවූ ඉල්ලුම, සාධකයන් දෙකක් විසින් යටපත් කරනලදී. සලාකය කැපීම නිසා නොමිලයේ ලබා ගැනීමට හැකි වූයේ සීමාසහිත ප්‍රමාණයක් පමණක් වීම එකකි. අනෙක වූයේ මිල ඉහළ යෑම හේතු කොට ගෙන පහළ ආදායම් ලබන පාරිභෝගික පංතිවල සහල් පාරිභෝජනය අඩුවීමය. මේ අනුව ආදායම් ඉහළ යන විට පාරිභෝජනය යටත් පිරිසෙයින් පෙර මට්ටම කරාවත් ඉහළයා හැකි වන මුත්, පවත්නා සැපයුම කෙරෙහි ඇති ඉල්ලුම් පීඩනය මිල ඉහළට නැංවීමට තුඩු දෙයි. මේ අතර ම නිෂ්පාදිතයෙහි වැඩිවීමක් හේතු කොට ගෙන සැපයුමෙහි වැඩිවීමක් ඇතිවුනමුත්, එම සැපයුම් ප්‍රමාණය දේශීය ඉල්ලුම් තත්වය සපුරාලීමට ප්‍රමාණවත් නොවිය. මුළු දේශීය නිෂ්පාදනයවූ ( බිත්තර වී අත්හැර ) වී බුසල් දශ ලක්ෂ 64.6 සහල් ටොන් 8,30,000 ක් හා සමාන විය. 1964 දී සහල් ටොන් 3,44,000 ක් සහ පිටි ටොන් 3,59,000 ක් ආනයනය කරනු ලැබීය. මුළු ධාන්‍ය සැපයුම තොග සඳහා ගැලපිලි කළ පසු ටොන් 1446 දහසක්වූ අතර, ඇස්තමේන්තු කළ ධාන්‍ය ඉල්ලුමවන ටොන් 1660 දහසින් 1 සියයට 88 කි. ඉල්ලුමෙහි වැඩි වෙමින් පවතින පීඩනයේ ( ඉල්ලුමට අඩු සැපයුමක් සහිත ) ප්‍රතිඵලයක් වශයෙන් විවෘත වෙළෙඳ පොලෙහි සිල්ලර මිල වැඩිවීම නොවැලැක්විය හැකිය. ගොවියා විසින් තම නිෂ්පාදිතයෙන් පාරිභෝජනය සඳහා ගත් ප්‍රමාණය කොතෙක්ද් දැයි දැන ගත නොහැකි විය. ඔහුගේ ආදායම් තත්වය වඩාත් යහපත් වන විට, ඔහුගේ නිෂ්පාදනයෙන් පෙරටත් වඩා වැඩි ප්‍රමාණයක් පාරිභෝජනයට ගනු ලබයි. මෙයට හේතු වූයේ සහල් සලාකය කැපී යාමය. කරුණු මෙසේ හෙයින්, විවෘත වෙළෙඳ පොලෙහි දී ලබාගත හැකි සහල් ප්‍රමාණය අඩු විය.

1. වසරකට සහල් සේරු 114 ක් සහ පිටි රාත්තල් 82 ක් වූ ඒකජන පාරිභෝජනය මත පදනම් වී ඇත.

Central ... Sri Lanka
22760
15 JUN 2009



කෘෂිකර්මයේ සම්ප්‍රදායික බවෙහි පරිවර්තනය, නිමැයුමෙහි සහ අස්වැන්නෙහි පමණක් නොව ආත්ම විශ්වාසයෙහි සහ ස්ථාවර ආර්ථික වෘද්ධියෙහි ද සැලකිය යුතු වෙනස්වීම් සිදු කොට ඇත. 1968 දී අපනයන නොවන කෘෂිකාර්මික නිමැයුමෙහි සිදුවූ රුපි. දශ ලක්ෂ 153 ක ප්‍රසාරණ යජාතික නිෂ්පාදිතයේ ඉහළ යෑමට සියයට 23 ක් සපයා ඇත. ඉකුත් වර්ෂ තුන තුළ දී ග්‍රාමීය ඉපැයීම් වැඩි වුවද, ග්‍රාමීය ඉතිරි කිරීම්හි සැලකිය යුතු වැඩිවීමක් සිදු වී නොමැත. 1968 දී ග්‍රාමීය බැංකු සතු කාලීන සහ ඉතිරි කිරීම් තැන්පතු වැඩි වූයේ, රුපියල් දශ ලක්ෂ 1.8 කින් පමණි. කෙසේ වුවද, ග්‍රාමීය ඉතිරි කිරීම් යොමු කරවන සම්ප්‍රදායික මාර්ගය වන තැපැල් කාර්යාලීය ඉතිරිකිරීමේ බැංකුවෙහි තැන්පතු රු:දා:ල: 12.4 කින් වැඩිවී ඇත. ග්‍රාමීය පෙදෙස්වල වෙළෙඳ බැංකු ශාඛාවන්හි ඉතිරි කිරීම් තැන්පතු ද රුපි. දශ ලක්ෂ 13.1 කින් වැඩි වී ඇත. සහල් නිෂ්පාදනයෙහි සහ අතිරේක බෝගයන් හී ස්වයංපෝෂිතතාවයක් සාක්ෂාත් කරගැනීමට ගොවියාට ආධාර කිරීම සඳහා ග්‍රාමීය අංශය වෙත සැපැයෙන ණය ප්‍රමාණය වැඩි කළ යුතුය. ණය ප්‍රමාණය වැඩි කිරීම නිමැයුමෙහි සහ ඵලදායිතාවෙහි ප්‍රසාරණයට සරිලන්නේවී නමුත්, ගොවියා අතට පත්වන අමතර ආදායම ගම්බද ප්‍රදේශයන් හී සිරිත් ලෙස පවතින අනවශ්‍ය වියදම් කරණකොට ගෙන නාස්ති විය හැකිය. මුළු පාරිභෝජනය කෙරෙහි වන මෙම එකතුව උද්ධමනීය පීඩනයන්ට හේතු වෙයි.

එම නිසා, ග්‍රාමීය ප්‍රදේශයන්හී ඉතිරි කිරීම් ඇති කරවීමෙහි ලා බැංකු ක්‍රමය සහ වෙනත් ආයතනයන් ව්‍යාප්ත කිරීම ඉතාමත්ම හදිසි අවශ්‍යතාවයක් වන්නේ ය. මීට වර්ෂ කිහිපයකට ඉහත දී ග්‍රාමීය ප්‍රදේශයන් හී බැංකු සේවාවන් ව්‍යාප්ත කිරීමේ මාර්ගයක් වශයෙන් ග්‍රාමීය බැංකු බිහි විය. මෙම වැඩ පිළිවෙල යටතේ, තෝරා ගනු ලැබූ විවිධ සේවා සමූපකාර සමිතීන්ට කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු බාර ගැනීමට අවසර දුන් විට, ඒවා ග්‍රාමීය බැංකු වශයෙන් හැඳින්විය. මෙම ග්‍රාමීය බැංකු ප්‍රධාන වශයෙන්ම සමූපකාර සමිති වන බැවින්, තැන්පත්කරන්නවුන් ඒවා කෙරෙහි විශ්වාසය නොතබන අතර දියුණුවක් ලැබූ ගොවීන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් භෞතික වත්කම් වෙත ආයෝජන කෙරේ. ග්‍රාමීය බැංකුවල දියුණුව රඳා පවතින්නේ තැන්පතුකරුවන් ගේ විශ්වාසය, බැංකු කටයුතු පිළිබඳව හුරුපුරුදුකම්වල දියුණුව, මෙම වාණිජ කටයුත්තෙහි ලාභදායීතාවය, එයින් ලබා දිය හැකි සේවය සහ ඒ ඒ ප්‍රදේශයන්ට විශේෂිත වූ සමාජ රාමුව ඇතුළත ක්‍රියා කිරීමට ඇති හැකියාව වැනි සංකීර්ණ සාධකයන් මතය. පාරිභෝගිකයන් සතු තැන්පතු වෙන් කර තැබීම හා බැංකු මූල ධර්මයන්ට අනුකූලවම මුදල් පාලනය කිරීම මෙම ග්‍රාමීය බැංකු නිවැරදි මඟට යොමු කිරීමේ එක් ආරම්භක පියවරකි. සමහර සමූපකාර සමිතිවල දැනට පවත්නා පරිපාලන දුර්වලතාවයන් හේතු කොට ගෙන, සමූපකාර සමිතිවලට අරමුදල් ලබා ගැනීමට මෙන් ම, සාමාජිකයන් වෙතත්, සාමාජිකයන් ගෙනුත්, ණය ලබා දීමට හැකිවේ ද යන්න සැක සහිත කරුණකි. තැන්පතුකරුවන් ගේ විශ්වාසය දිනා ගැනීම සඳහා ග්‍රාමීය බැංකු විසින් තැන්පතුවල සුරක්ෂිතතාවය තැන්පත් රක්ෂණ ක්‍රමයක් මගින් සහතික කරදීම පමණක් නොව ඵලදායී නිෂ්පාදිත කටයුතු සඳහා ණය සපයන අතරම, ඇතැම් පාරිභෝජන කටයුතු සඳහා ද සීමා සහිත ණය පහසුකම් ලබා දිය යුතු වන්නේ ය.

එවිට කෘෂිකාර්මික ණය ක්‍රමය, අනුක්‍රමයෙන් මෙම ග්‍රාමීය බැංකු වෙත පවරාගත හැකි වන්නේ ය. ඒ කෙසේ වතුදු, මැදිකාලීන හා දිගු කාලීන කෘෂිකාර්මික ණය සැලැසීමේ අවශ්‍යතාවය තවත් වැඩි වන අතර, කෘෂිකර්මයේ විශාල පරිවර්තනයක් ඇති කිරීම සහ එමගින් කෘෂිකර්මය දෙසට යොමුවූ කර්මාන්ත ඇති කිරීම් වස් ණය දීමේ ප්‍රතිපත්ති නැවත සැකැසීමෙහි ලා ණය ප්‍රතිපත්තිවල විශාල ප්‍රතිසංස්කරණයක් ඇති කළ යුතු වෙයි. යෝජිත සංවර්ධන බැංකුව, කෘෂිකර්ම අංශයේ අවශ්‍යතාවයන් සපුරාලනු පමණක් නොව, ආර්ථික වශයෙන් සතුටුදායක යෝජනා ක්‍රමයන්ට ක්‍රියාශීලීව සහායවීමෙන් කර්මාන්ත අංශයේ පුලුල්වීමට ද උදව් දෙනු ඇත.

පශුධන භාණ්ඩ නිපදවීම සඳහා පුළුල් වැඩ පිළිවෙලක් වෙනුවෙන් මෙම කෘෂිකාර්මික ණය මුදල් සැපැයීමට එවිට හැකි වනු ඇත. ණය ක්‍රමය පාලනය කිරීමෙහිලා අළුත් උනන්දුවක් අවශ්‍යව ඇත. එමගින්, නිමැවුම අනුව ණය සැපැයීමට උත්සාහ දරන කෘෂිකර්මය වෙත සතුටුදායක ණය ප්‍රමාණයක් සැපැයීම හා ඒ මගින් සම්පත් උපයෝගී කර ගන්නා ආකාරය දියුණු කොට නිෂ්පාදනය සා ඉපැයීම් උසස් මට්ටමකට ගෙන යාම අවශ්‍ය ය. අඩුලුහුඩුකම් බොහොමයකට ම ප්‍රධාන වශයෙන් හේතු වනුයේ, අතීතයේ දයාදයන් ගෙන් උද්ගත වෙන නෛසර්ගික ප්‍රවණතාවයන් ය. මෙම අඩුලුහුඩුකම් සම්ප්‍රදායයන්හි මුල් බැසගත් සංකීර්ණ ප්‍රශ්න රාශියක කොටසකි. ඇතිකරගතහැකි හා උකහාගතහැකි වෙනස්කම් රඳනු ඇත්තේ නොයෙකුත් ගැටලු අවබෝධ කරගැනීමෙන් ආර්ථිකයේ ව්‍යුහය වෙනස්වීමේ වේගය මත සහ තුල්‍ය වර්ධනයක් ඇතිකිරීමේදී නිවැරදිකිරීමේ ක්‍රියාමාර්ගයන්ගේ ආධාරයෙන් ලැබෙන පිටුවහල මතය.

**(ආ) කාර්මික නිෂ්පාදනය**

කාර්මික නිෂ්පාදනය ( මුර්ත ලෙස සියයට 7 වන ) දළ ජාතික නිෂ්පාදිතයෙන් කුඩා සමානුපාතිකයක් පමණක් වන හෙයින්, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක ප්‍රධාන ස්ථානය හිමි විය යුත්තේ සෑහෙන තරම් විශාල හා එසේ ම නවීන කාර්මික නිෂ්පාදනය තව තවත් දියුණු කිරීම කෙරෙහිය. කෘෂිකාර්මික හා කාර්මික අංශ අතර, යම් ප්‍රමාණයක් තුලනයක් පවත්වා ගැනීමට දක්වන උනන්දුව ඇත්තෙන් ම කෙටි කාලීන අවශ්‍යතාවයකි. කෘෂිකර්මයෙහි ඇති වැදගත්කම දිගු කාලයේ දී ආර්ථික අතින් පිරිහෙනු ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන්, ආදායමෙහි පහළ ඉල්ලුම් නැම්යාව, කර්මාන්තවල කෘත්‍රිම ද්‍රව්‍ය යෙදවුම් ආදේශනය වැඩි වීම කුසහ අමු ද්‍රව්‍ය උපයෝගී කර ගැනීමේ දී කරනු ලබන පිරිමැසුම් ය. මෙයින් අදහස් වනුයේ කෙටි කාලයේ දී කෘෂිකාර්මික සංවර්ධන ප්‍රශ්නය වෙත තියුණු අවධාරණය යොමු නොකළහොත්, සමස්ත ආර්ථික සංවර්ධනය එනම්, අවසානයේ දී කෘෂිකර්මයෙහි වැදගත්කම පිරිහීමට තුඩු දෙන තත්වය පැමිණීම වැලකී යනු බවයි.

කෘෂිකර්මය, එහි අමු ද්‍රව්‍ය විශාල සංඛ්‍යාවක් කර්මාන්ත වෙතින් ලබා ගනියි. කෘෂිකර්මයේ නවීනකරණය වැඩි වූ තරමට, කර්මාන්තයෙහි උත්පාදනය වන යෙදවුම්වල පරිමාව සහ වටිනාකම ඉහළ යනු ඇත. මහ බැංකුව විසින් මෑත දී පවත්වන ලද වී නිෂ්පාදන වියදම් පිළිබඳ සමීක්ෂණයට අනුව ලංකාවේ කුඹුරු ඉඩම් අක්කර ප්‍රමාණයෙන් සියයට 24 කට ආසන්න ප්‍රමාණයක් යන්ත්‍රානුසාරයෙන් වගා කරනු ලබයි. කෘෂිකර්මය යන්ත්‍රානුසාරයෙන් කැරෙන විට, එම යන්ත්‍ර අළුත් වැඩියා කිරීමේ සේවා, සෑදීම හා ඒවා සම්බන්ධ අනෙක් සහයෝගී කටයුතු ඇති වෙයි. විශේෂ ප්‍රාගුන්‍යය වැඩිවීමත් සමග ම ගොවි පොලෙහි දී කෙරුනු කාර්මික කටයුතු ඉන් පසුව කාර්මික අංශයෙහි කෙරෙනු ඇත.

කෘෂිකර්මයේ ම සමෘද්ධිමත් කාලයක් අවුරුදු තුනක් තිස්සේ නැවැතුණි. කෘෂිකාර්මික අංශයේ ඉහළ ගිය ආදායම යලිත් ලබා ගැනීම විශේෂයෙන් ම වැදගත්වී ය. එසේනොවුනහොත් පාරිභෝජනය වර්ධනය වන අතර, සමහර පාරිභෝජන භාණ්ඩ ( ඇඳුම්, ආහාර, දුම්කොළ ආදිය) සඳහා වූ ඉල්ලුම ඊටත් වඩා වේගයෙන් ඉහළ යනු ඇත.

කර්මාන්තවල ආනයන ආදේශණයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ඇති බව මහ බැංකුව විසින් පවත්වන ලද කාර්මික නිෂ්පාදනය පිළිබඳ සමීක්ෂණයෙන් සනාථ විය. කාර්මික සේවා නියුක්තිය සියයට 36 කි න් ද, ශ්‍රම යෙදවුම් (මිනිස් දින සංඛ්‍යාව) සියයට 42 කින් ද, මිනිස් දිනක නිමැවුම සියයට 2.5 කින් ද වැඩි විය.

මුළු ඵලදාවේ ද වැඩිවීමක් සිදු විය. ඒක පුද්ගල ශ්‍රම නිමැවුම 1967 පැවති රු. 13 සිට 1968 රු. 13.8 දක්වා වැඩි විය. 1965 න් පසු කර්මාන්ත ගණයන් බොහොමයක ම ඵලදාව වැඩිවීමේ උපනතියක් පෙන්නුම් කරමින් පැවැතුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන් ම 1966 න් පසුව ආදායම ඉහල යෑම හේතු කොට ගෙන, විදේශීය වෙළෙඳ පොල පුළුල්වීම සහ යන්ත්‍ර පට්ටල පෙරට වඩා වැඩියෙන් උපයෝගි කොට ගැනීමය. 1964 දී විදේශීය විනිමය සීමා කිරීම කාර්මික නිෂ්පාදන කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. මෙය හා සමග අධි අගයක පිහිටි විනිමය අනුපාතයක්, වැඩි වී පෙණුන ආයෝජන හා නිෂ්පාදන වියදම්, පාවිච්චි නොකෙරුණු ධාරිතා හේතු කොට ගෙන 1965 මුල දී වර්ධන අනුපාතය බාල විය. එහෙත්, විදේශ විනිමය වෙන් කිරීම් වැඩි කිරීම නිෂ්පාදන ධාරිතාව වැඩියෙන් උපයෝගී කර ගැනීම හා අළුත් කර්මාන්ත ඇතිවීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන නිෂ්පාදනය ඉන් පසු කැපී පෙනෙන ලෙස වැඩි වනු දක්නට ලැබුනි. ප්‍රමාණාත්මක සීමා කිරීම් සහ කාර්මික කටයුතුවලට විනිමය වෙන් කිරීම්, සීමා විශේෂතාවයනට තුඩු දෙන අතර අවසානයේ දී අහිත කර කර්මාන්තයන්ගේ වර්ධනයට ද හේතු වෙයි. විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ඇතිකිරීමෙන් එවැනි බාධක ඉවත් කෙරෙන අතර, ප්‍රරෝහන ශක්තියෙන් යුක්ත කාර්මික අංශයක් ඇති වීම සඳහා සම්පත් හා ආධාර වෙන් කිරීම, වෙළෙඳ පොලේ බලවේග වෙත පැවරෙනු ඇත.

මෑත වර්ෂයන්හි දී රජය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති 1968 දී සාමාන්‍ය වශයෙන් නිමැවුම පුළුල්වීම සහ විශේෂයෙන් ම කාර්මික අපනයන වල වැඩිවීමට උපකාරී විය. කාර්මික අංශයට සීඝ්‍ර ලෙස වර්ධනය විය හැකි වුවද, ආනයන මත පදනම් වූ දේශීය වෙළෙඳ පොලට යොමු වී ඇත. කර්මාන්ත විවිධ භාණ්ඩ අපනයනය කිරීම සඳහා යොමුවෙන අන්දමට නැවත සකස් කළ යුතුය.

## ( 3 ) ප්‍රතිපත්ති හා විධිවිධාන

### (අ) විදේශීය ගෙවුම් සහ විනිමය ක්‍රමය ප්‍රතිසංස්කරණ කිරීම

ගෙවුම් ශේෂයේ නිතර නිතර ඇතිවුණු හිභයන් හේතු කොට ගෙන, විදේශීය වත්කම් නොකඩවා අඩු වී යාම 1964 පළමුවන කාර්තුවේ දී උග්‍ර අර්බුදකාරී තත්ත්වයක් ඇති කළේය. දැඩි ලෙස ආනයන පාලනය කිරීමත්, අවශේෂ වශයෙන් යහපත් තත්ත්වයක් අපනයන අංශයේ ඇතිවීමත් හේතු කොට ගෙන 1965 දී ඇති වූ සුළු අතිරික්තය හැරුණ විට, 1968 දක්වාම ගෙවුම් ශේෂය සටහන් කළේ හිභයන්මය. ගෙවුම් ශේෂයේ ඇතිවූ මෙම පීඩනයන්ට හේතු වූයේ, පාරිභෝජන වියදම් ( ආනයන සඳහා වන වියදම් ඇතුළුව ) ඉහළ යාමය. පාරිභෝජන වියදම්වල ඉහළ යාම අපනයනවල වැඩිවීමට වඩා වේගයෙන් සිදුවිය. 1959 සහ 1967 අතරතුරේදී පරිභෝජන වියදම් ( පෞද්ගලික සහ පොදු) සියයට 40 ක වේග-යෙන් ඉහළ ගිය අතර, අපනයන ඉහළ ගියේ සියයට 10 ක වේගයෙනි. පොදු ආර්ථික සංවර්ධ-නය සඳහාත් විශේෂයෙන්ම ආනයන ආදේශන වැඩ පිළිවෙල පවත්වා ගැනීම සඳහාත්, ආයෝජන හා අන්තර් භාණ්ඩ රාශියක් ආනයන කිරීම අවශ්‍ය විය. එහෙත් විදේශීය විනිමය සංචිත විශේෂයෙන්ම 1964 හා 1965 දී පැවති තත්ත්වය මෙම භාණ්ඩ තරමක් දුරට හෝ නිදහසේ ආනයන කිරීමට ඉඩ නොදුන් හෙයින්, වැඩිදුරටත් දේශීය නිෂ්පාදනය පහළ වැටුණි. මේ සමගම අපනයන ඉපයුම්වල පහළ බැසීමේ උපනතිය නොකඩවා පැවතුණි. මේ අතරතුරේ දී, ඉහළ පාරිභෝජන මට්ටමෙන්, හා සංවර්ධන අවශ්‍යතාවයන්ගෙන් අනුබල ලද ආනයන වියදම් ද ඉහළ යාමට පටන් ගති. විනිමය අනුපාතය අධි අගයක පිහිටීමෙන් දේශීය හා විදේශීය මිල අතර සම්බන්ධතාවය විකෘත වී ගිය අතර, ආනයනයන් ලාභ වූ අතර අපනයනයන්ගේ මිල අධික විය. ප්‍රධාන ආනයන භාණ්ඩයන්ගේ මිල පහළ යාම සහ එහි නිෂ්පාදන ව්‍යුහයේ දැඩි අනම්‍යතාවයන් ඇතිවීම හේතු කොට ගෙන වාර්ෂික අපනයන ඉපයුම් ප්‍රමාණය ආනයන මට්ටමටත් වඩා පහළ වැටුණි. දේශීය වෙළඳ පොල කෙරෙහි යොමු වී ඇති, ආනයන ආදේශන කර්මාන්තයන් ගෙන් සමහරක් ආනයන කනර ලද අමු ද්‍රව්‍යයන් ගෙන් බොහෝ දුරට යැපුණ අතර, දේශීය වශයෙන් අවශ්‍ය වූ යෙදවුම් ප්‍රමාණය කුඩා වුවද, එකී කර්මාන්තයනට, කාර්මික වශයෙන් ලබා ගත හැකි වන නිමවුම් මට්ටමෙන් ඉතා පහතට නොවැටී කටයුතු කරගෙන යාමට හැකි වනු වස් විදේශීය විනිමය සැපයිය යුතු විය. 1964 වන විට විනිමය සංචිත තත්ත්වය කොතරම් උග්‍රවූයේද යත් සාමාන්‍ය ප්‍රතිපත්තියෙන් ඈත් වීම නොවැළැක්විය හැකි වූ අතර, විදේශීය විනිමය පිළිබඳ යථා තත්ත්වයට මුහුණ දීමට හැඩ ගැසෙන ලෙස කර්මාන්ත වලට දැනුම් දෙන සිටින ලදී.

වෙළෙඳ පොළේ ක්‍රියාකාරිත්වය මෙසේ විකෘති වූ තත්ත්වයක් යටතේ, සැබෑ විනිමය අනුපාතයක සාමාන්‍ය ආරක්ෂාකාරිත්වයක් ලබා නොදෙන නිසා ආනයන ආදේශන කර්මාන්ත-වල වර්ධනයට බාධා පැමිණෙනු ඇත. අධි මිලක පිහිටි විනිමය අනුපාතය ආර්ථික ක්‍රමයේ වර්ධනය පමා කළා පමණක් නොව, විදේශීය විනිමය සංචිත වල සීඝ්‍ර පිරිහීමට ද හේතු විය. සංචිතයන් ගේ මට්ටම 1957 දී ආනයනවල වටිනාකමින් සියයට 54 ක් වූ අතර, 1967 දී සියයට 20 දක්වා පහළ වැටුණි. රටේ ආනයන හැකියාව දක්වා ඇති පහත දැක්වෙන සංඛ්‍යා සටහන අනුව, විශාල සම්පත් පරතරයක් ඇති වූයෙන්, විදේශාධාරවලින්, විශාල වශයෙන් විදේශීය සංචිත අඩු කර ගැනීමෙන් සහ කෙටි කාලීන ණය ගැතියාභාවය වැඩි කර ගැනීමෙන් අත්‍යාවශ්‍ය පාරිභෝජන සහ ආයෝජන ආනයන, මුදල් කිරීමට සිදු විය.

**1 — 7 වැනි සංඛ්‍යා සටහන**

**ආනයන කිරීමේ හැකියාව ( 1959 මිල )**

රුපි. දශ ලක්ෂ

| වර්ෂය | දේශීය අපනයන | වෙළෙඳ අනුපාතය | ශුද්ධ ප්‍රාග්ධන සංචලන | ශුද්ධ සාධක ගෙවුම් | ආනයන කිරීමේ හැකියාව | නියම ආනයන |
|---|---|---|---|---|---|---|
| 1960 | 1777 | –11 | 2 | –44 | 1724 | 1939 |
| 1964 | 2060 | –316 | 2 | –34 | 1712 | 1870 |
| 1966 | 1928 | –505 | –12 | –36 | 1375 | 1740 |
| 1967 | 2002 | –667 | – 2 | –45 | 1288 | 1442 |
| 1968 | 2022 | –821 | – 4 | –39 | 1158 | 1385 |

නියත වශයෙන් කරන ලද ආනයන ප්‍රමාණය රටේ ආනයන හැකියාව ඉක්මවාලිය. කරුණු මෙසේ හෙයින්, විදේශීය විනිමය පිළිබඳ දිගින් දිගට ම පැවතෙන ප්‍රශ්නයක් උද්ගත විය යුතු ය. විදේශීය සංචිත ප්‍රමාණවත් නොවන කල්හී සම්පත් පරතරය පියවනු ලබනුයේ ප්‍රධාන වශයෙන් විදේශ ණය ගැනුම් මගිනි. ක්ෂණික ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා මෙම ක්‍රමය උපකාරී වෙයි. මෙම ක්‍රමය මගින් සම්පත් පරතරය පියවීමට ක්ෂණික පිටුවහලක් ලැබෙතත් අපනයන වැඩි කිරීම හෝ ආනයන අඩු කිරීම හෝ එසේ නැතිනම් ඒ දෙකම සඳහා එසේ ලබා ගන්නා ලද ණය මුදල් උපයෝගී කොට නොගතහොත්, ණය සේවා කිරීම් හේතු කොට ගෙන අනාගතයේ දී වඩා විශාල වූ සම්පත් පරතරයක් උද්ගත වනු ඇත.

නියම ආනයන ප්‍රමාණය හා සසඳා බලන කල ආනයන කිරීමේ හැකියාව හීනවීම, විදේශීය විනිමය සම්බන්ධයෙන් ක්‍රියාශීලි කළුකඩයක පැවැත්ම, සහ දැඩි පාලන ක්‍රමය කෙරෙහි වැඩි වැඩියෙන් විශ්වාසය තැබීම යන සැම කරුණක් ම අතාත්වික විනිමය අනුපාතික පැවැත්ම දක්වයි.

1967 නොවැම්බර් මාසයේ දී රුපියල සියයට 20 කින් අවප්‍රමාණ කරන ලදී. එහෙත්, එම නව අනුපාතිකය යහපත් මූලික අනුපාතිකයක් වුවද, භාණ්ඩ රාශියක් සම්බන්ධ ආනයනය ලිහිල් කිරීමට තරම් තාත්වික නොවන බැව් ද එකල වැටහුනි. තවදුරටත් අගය අඩු කරනු ලැබූ ඒකීය අනුපාතිකයකින්, මෙම තත්ත්වය සමහර අංශවලින් විසඳිය හැකි වුවද, එයින් දේශීය ආර්ථිකයේ තවත් දුෂ්කර ප්‍රශ්න උද්ගතවීමට ඉඩ තිබුණි. එහෙයින් ප්‍රධාන අපනයන භාණ්ඩ වෙනුවෙන් තිබි, ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සියයට 20 ක අවප්‍රමාණයක් ප්‍රමාණවත් වනු ඇත. අනෙක් ප්‍රශ්න විසඳීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බව හැඟුණි. එමෙන් ම ආනයන අංශය දෙස බලන විට, සියයට 20 කින් අවප්‍රමාණ කිරීම අත්‍යාවශ්‍ය ආනයනයන් රාශියක-ගේ වියදම් ඉහළ යාමට හේතු වූ අතර, විශේෂයෙන් ම අර්ථ ක්‍රමයේ වර්ධනය වෙමින් පවතින අංශයන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ආනයනය ලිහිල් කිරීමට තරම් එය ප්‍රමාණවත් නොවිය. එහෙයින් ලංකාවේ ගැටලුවට විසඳුම වනුයේ යම්කිසි බහු අනුපාතික ක්‍රමයක් බව පෙනී ගියේය.

1966 ට පසු ඉතා සීමිත වශයෙන් යොදා ගත හැකි වූ ප්‍රතිදන වවුචර ක්‍රමයක් ලංකාවේ ක්‍රියාත්මකව පැවතුණි. පවත්නා තත්වයන්ට අනුව ගත්කල, පිරිහුනු ඒකීය අනුපාතිකයන් මෙන් නොවද විවිධ විනිමය අනුපාත ක්‍රමයක් මගින් අපනයන නගාලීම සහ ප්‍රසාරණය සඳහා වඩාත් ක්‍රියාශීලි ක්‍රියා මාර්ගයන් සැලසෙනු ඇත යන මතය ලංකාවේ දී මෙන්ම වෙනත් තන්හිද මෙම ක්‍රමය පිළිබඳව ලැබූ අත් දැකීම් වලින් සනාථ වන බව පෙනේ.

මෙම වාර්තාවෙහි අන් තැනක දක්වා ඇති පරිදි, 1968 දී දේශීය අංශය සඳහා කළ කෘෂි-කාර්මික නිෂ්පාදනය සියයට 29 කින් ඉහළ ගිය අතර, කාර්මික නිෂ්පාදනය සියයට 47 කින් වැඩි විය. වෙනත් වෙළෙඳ පොලවල තරඟකාරිත්වය තියුණු වන විට දී නිෂ්පාදන අපනයනයන් පිහිටාධාර යටතේ පුළුල් කළ හැකි ය. තාත්වික විනිමය අනුපාතයක් මගින් මෙම අරමුණ වඩා පහසු මාර්ගයකින් ඉටු කර ගත හැකිය. නියම අනුපාතයෙහි ප්‍රතිසංස්කරණයක් මගින් අපනයන වැඩි දියුණු කළ හැකි වන්නේ දේශීය මිල මට්ටමෙහි සාපේක්ෂවූ ස්ථාවර රාමුවක් තුළ සිට පමණි. අත්‍යාවශ්‍ය භාණ්ඩවල දේශීය මිල මට්ටම් ඉහළයාමේදී, එමගින් වැටුප් සහ වෙනත් වියදම් ඉහළ නංවයි. ඒ සමගම මූල්‍ය ප්‍රසාරණය සීමා නොකළහොත් එමගින් නිරන්තර උද්ධමනයක් ඇති වනු ඇත.

යටත් පිරිසෙන් විනිමය අනුපාතයන් දෙකක් පැවතීමේ අවශ්‍යතාවයක් ඇතිවිය. මින් එකක් අත්‍යාවශ්‍ය ආනයනයන්ට සහ ප්‍රධාන අපනයනයන්ට අදාළ වන "නිල" විනිමය අනුපාතිකයක් වන අතර, අනෙක සැම අපනයනයන් හා ආනයනයන්වලට අදාළ වන "චල" හෝ දෙවැනි විනිමය අනුපාතිකයක් වනු ඇත. විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ඉදිරිපත් කරනු ලැබුයේ මේ සම්බන්ධයෙනි. මෙම ක්‍රමයේ අරමුණු දෙකක් තිබුණි. එක් අරමුණක් වූයේ අපනයනයන් වැඩි කිරීම හා ඒවා නානාංගකරණය කිරීමයි. අනෙක් අරමුණ වූයේ, විදේශීය විනිමය සංචිත පහත යමින් පවතින විටක දී දැඩි ආනයන පාලන සහ සලාක කිරීම් මගින් භාණ්ඩ සැපැයුම පාලනය කරනවාට වඩා ආනයන ගලා ඒම් ක්‍රමවත් කිරීමෙන් වෙළඳ පොලේ ක්‍රියාකාරිත්වයට ඉඩ හැරීම සඳහා ආනයනයන් ලිහිල් කිරීමය.

ආනයනයන් පුළුල් ලෙස ගණ 3 කට වෙන් කරන ලදී. මේ පිළිබඳ විස්තර මෙම වාර්තාවේ වෙනත් කොටසක සඳහන් කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි උපදේශ අනුව, 1968 මැයි මස 6 වැනි ද සිට, රජය විසින් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ආරම්භ කරන ලදී. මෙම වැඩ පිළිවෙල මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

පළමුවරට විනිමය අනුපාතයන් මගින් අපනයනය කිරීමේ හැකියාවන් ගෙන් යුත්, තෝරා ගත් වර්ධන අංශයන්ට පෙළඹවීමක් දීමට සහ ආනයන ආදේශක කර්මාන්තවලට වැඩි ධෛර්යයක් ලබා දීමට උත්සාහයක් දරා ඇත. ආනයන සඳහා තරඟ කරන කර්මාන්තයන් පිළිබඳ අරමුණු වනුයේ අමු ද්‍රව්‍ය, යන්ත්‍ර සහ කාර්මික උපදෙස් මාලා ආනයනය නියම විදේශ විනිමය මිල අනුව පදනම් කිරීමෙන් ව්‍යවසායයන්හි දිගු කාලීන ප්‍රරෝහන ශක්තිය අත්කර ගැනීම සඳහා උපකාරී වීමත්, ප්‍රමාණාත්මක පාලනයක් සහ බලපත්‍ර දීමේ වැඩ පිළිවෙලවල් අනුක්‍රමයෙන් ඉවත් කිරීමක් මගින් ආනයන පහසුවෙන් ගලාර්ම පිළිබඳව සහතික වීමත් ය.

විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය වනාහී තෝරා ගනු ලැබූ අපනයනයන් සහ අදෘශ්‍යමාන ගනුදෙනු සඳහා මූල්‍යමය දිරිගැන්වීම සැලසීමටත් සහ තෝරා ගනු ලැබූ ආනයනයන් සහ අදෘශ්‍යමාන ගෙවුම් සඳහා රුපියල් වලින් අමතර වියදමක් පැනවීමටත් අරමුණු කරගත් උපකරණයකි. බාහිර ලෝකය සමග වූ අනිකුත් සියළුම ලැබුම් සහ ගෙවුම් නිල විනිමය අනුපාතිකය අනුව ගනුදෙනු කළ යුතු අතර, සහ ඒවා ''අ'' මාර්ගයෙහි ගනුදෙනු වශයෙන් සලකන්නට විය. එකී ක්‍රමය පාලනයට යටත්වූ ''ආ'' වර්ගයේ ගණුදෙනු වශයෙන් සඳහන් කැරුන අතර, විදේශීය විනිමය හිමිකම් සහතික පත්හි මිල ස්වරූපයෙන් වූ අමතර රුපියල් ප්‍රතිලාභයක් හෝ වියදමක් ඇතිවීම ඒවායේ විශේෂ ලක්ෂණය විය. ආරම්භයේ දී සහතික පත්වල මිල නිගමනය කිරීමට අදහස් කර ඇත්තේ, වෙළෙඳ පොලේ මිල වෙගයන් මගින් බැවි මහ බැංකුව විසින් සතිපතා ඉදිරිපත් කැරුන සහතික පත් සඳහා වූ ටෙන්ඩර් මිලෙන් පෙනී යනු ඇත. එසේ වුවද, ඊට අනතුරුව රුපි. 100 මුහුණත වටිනාකමක් ඇති සහතික පතක මිල රු. 44 කට ස්ථාවර කරනු ලැබූ අතර, එය මූලික වශයෙන් වල අනුපාතිකයක් වූ එම මට්ටමෙහි ම රැඳී පැවැතිනි.

මෙම වැඩ පිළිවෙළෙහි වැදගත් වූ ලක්ෂණයක් වන්නේ ''ආ'' වර්ගය යටතේ සඳහන් කොට තිබෙන සැලකිය යුතු ප්‍රමාණයක ආනයනයන් එක් වරම විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතට ගෙන ඒමෙන් එවකට පැවැති ආනයන සලාක සහ බලපත්‍ර සඳහා වූ අවශ්‍යතාවයන් ඉවත් කරලීමය. මෙකී භාණ්ඩයන් වූයේ ප්‍රධාන වශයෙන් ම කර්මාන්තයන් සඳහා වූ අමුද්‍රව්‍යය. මෙම ආනයන සඳහා ගෙවීම, වෙළෙඳ බැංකු සමග ණයවර ලිපි ඇරඹීමකට යටත්විණ. කර්මාන්තයන් නඟාලීමටත්, ඒවායේ කාර්යක්ෂම වර්ධනයටත් , මෙම සැලකිය යුතු වූ ලිහිල් කිරීම හේතු වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

මෙම වැඩ පිළිවෙල සාර්ථක අයුරින් පවත්වා ගෙන යැම සඳහා අතිරේක වශයෙන් මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන්නේ ය. අර්ථ ක්‍රමයෙහි දැනටමත් වර්ධනය වෙමින් පවතින කල්හි, මූල්‍ය ප්‍රසාරණයක් මගින් ආර්ථික වර්ධනය විනාශ වී යන වැඩ පිළිවෙලක් ඇති නොවන බවට වග බලා ගත යුතුය. එම නිසා, නිෂ්පාදන අංශයේ අවශ්‍යතාවයන් ඉක්මවා යෑම වලකාලීමටත්, පරිභෝජනය හෝ සමපේක්ෂණ තොග රැස්කිරීම ධෛර්යමත් කිරීමටත්, ණය මුදල් මැවීම සීමා කළ යුතු වන්නේය. එම නිසා ණය පාලනය මෙම ක්‍රමයේ සැකැස්මට අයත් වූ වැදගත් අංගයකි. පිස්කල් අංශයෙන් බලන විට, රාජ්‍ය මූල්‍ය පරිහරණයෙහි උද්ධමනීය බලපෑම අනුක්‍රමයෙන් ඉවත් කිරීමේ පරමාර්ථය පෙරදැරි කොට බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය මුදල් අවම මට්ටමක් කරා ගෙන ඒමට යත්න දරා ඇත. පිරිවැය සහ ලාභයන් සම්බන්ධ නව තත්වයට ගැලපෙන පරිදි ආනයන තීරුබදු සහ පිරිවැටුම් බදු සකස් කළයුතු විය.

වි. වි. හි. ස. ක්‍රමය ආරම්භ කළ මුල් කාලයේ දී ඒ සහතික පත් සඳහා ඉහළ මට්ටමක ඉල්ලුමක් ඇති විය. වෙළෙඳ පොලේ අනුපාතික නිගමනය කිරීම් වස්, ආරම්භයේ දී විදේශ විනිමය සහතික පත් ටෙන්ඩර අනුව විකුණු අතර, මිල උච්චාවචනයෙහි විශාල පරතරයක් ඇති විණි. වි. වි. හි. ස. මිල සියයට 44 හි රැඳුන විට, ව්‍යාපාරිකයනගේ ප්‍රතික්‍රියාව වෙනස් අයුරක් ගත්තේ ය. වි. වි. හි. ස. වැඩ පිළිවෙල කෙරෙහි ඔවුන්ගේ විශ්වාස ය වැඩි විය. වි. වි. හි. ස. පත් හි හා මිලට ගැනුම ඇරඹීම ද, ඉදිරි විකුණුම් ද වි. වි. හි. ස. වෙළෙඳ පොලෙහි ස්ථායී තත්වයක් ඇති කිරීමෙහිලා උපකාරී විය.

ඇතැම් ප්‍රමාණාත්මක සීමා කිරීම් ලිහිල් කිරීම් වෙනුවට පිරිවැය සීමා කිරීම් යෙදීමට සිදු විය. ආනයනය විනිමය අනුපාතිකය සඳහා භාණ්ඩ ප්‍රමාණය වැඩි කරලීමට හිතකර විය. එනමුත්, ආනයනයන් සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම හේතු කොට ගෙන, ආනයනය කිරීමේ හැකියාව සීමා වුන අතර, සහ ඇති ඉල්ලුමෙහි නම්‍යතාවයට අනුකූලව සැපයුම හැඩ

ගැස්වීමට ආනයනකරුවනට සිදුවිය. සලාක යටතේ තරමක් ඉහළව පැවැති ලාභ ප්‍රමාණය මිලෙහි බලපෑම නිසා, අඩුවන්නට ඇත. තරඟකාරී තත්වය වැඩිවෙත් ම, භාණ්ඩයන් ගේ මිල අඩුවීමේ ස්වරූපයෙන් ලාභයන් ගෙන් කොටසක් පාරිභෝගිකයන් අතට පත්වීමට ඉඩ තිබෙන අතර, එසේ නැතහොත්, ඉහළ යන පිරිවැය මධ්‍යයෙහි මිල ස්ථාවරව පවත්වා ගනු ඇත. විදේශීය වෙළෙඳ පොළවල අලෙවි කිරීම ධෛර්මත් කිරීම හෝ ආනයන සඳහා තරඟ කරන නිෂ්පාදනයන්, කුඩා සලාක ප්‍රමාණවලින් ආනයනය කිරීම සඳහා ඉඩ දීම කාර්යක්ෂමතාවය දියුණු කිරීමෙහිලා සහාය වන පිළිවෙත වෙයි. ඉහළ මිලකට ආනයනයන් ලබා ගැනීමට හේතු වීම නිසා අමු ද්‍රව්‍ය අන්තර්භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පවා පිරිමැසුම් සහිතව පාවිච්චි කිරීමට නිෂ්පාදකයන්ට සිදුවන අතර, ඔවුන් විසින් මිලදී ගනු ලබන විදේශීය විනිමය සුවිධානයෙන් යුතුව ප්‍රයෝජනයට ගනු ඇත.

වි. වි. හි. ස. ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කළ විගසින් ම අවිශ්වාසය නිසා භාණ්ඩ තොග රැස් කිරීම වැඩිවිය හැකි නමුත්, වැඩ පිළිවෙල කෙරෙහි පවතින ව්‍යාපාරික විශ්වාසය වර්ධනය වෙත්ම මෙම තොග රැස්කිරීම අඩු වී යනු ඇත. සමපේක්ෂණ කාර්යයන් සඳහා ණය දීම දුර්වල තත්වයකට පත් කිරීමත්, ඒ සඳහා වියදම් වැඩි කිරීමත් කෙරෙහි මූලා ප්‍රතිපත්තිය යොමු වී ඇති හෙයින්, භාණ්ඩ තොග රැස්කිරීම ඉතාමත් වියදම් ගෙන දෙන කටයුත්තක් ය. දැනට පවතින ණය මුදල් පිළිබඳව උපරිම සීමාවන් පැනවීම් නිසා රාශිකරණය සඳහා ණය ගැනීමට නොහැකි වෙයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමුච්චිත කොට තිබූ ආයෝජනයන් සඳහා වන සියළු ම තොග මුදා හැරීමට ඉඩකඩ ඇති අතර, එමගින් මිල පහත වැටීමට හේතු වන පරිදි පීඩනය ලිහිල් වෙයි.

විදේශීය විනිමය සහතික පත්‍ර ක්‍රමයෙන් ඇති වන මිලෙහි බලපෑම් විශේෂිත භාණ්ඩයන්හි ඉල්ලුම් නම්‍යතාවය මත රඳයි. මෙසේ සමහර භාණ්ඩවල මිල පහත වැටුනු අතර, සමහර ඒවා මිල ඉහළ නැඟුනි. නැති නම්, ස්ථාවරව පැවැතුනි. ගොඩනැගිලි උපකරණ සහ සනීපාරක්ෂක භාණ්ඩවල මිල පහළ වැටුන අතර, සනීපාරක්ෂක භාණ්ඩවල පහළ වැටීමේ ප්‍රතිශතය ගොඩනැගිලි උපකරණවල පහළ වැටීමේ ප්‍රතිශතයට වඩා වැඩි වූ අතර, බටර්, කිරි වැනි ආහාර ද්‍රව්‍ය සහ මෝටර් රථ අමතර කොටස් වැනි වෙනත් භාණ්ඩවල මිලෙහි ඉහළ නැගීමක් ඇති විනි.

විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය නිසා සමහර කර්මාන්තවල යෙදවුම්වල දේශීය නිෂ්පාදන පිරිවැය ඉහළ නැඟුණි. ද්‍රව්‍යමය පිරිවැයෙහි වැඩිවීමක්, අවප්‍රමාණය කිරීමත් සමග වැටුප් මට්ටම්වල ගැලපුම් නිසා සාධක පිරිවැය ඉහළ යාමත් යන කරුණු දෙක ම කාර්මික භාණ්ඩවල පිරිවැය ව්‍යුහය වැඩි කිරීමට හේතු විය. එනමුදු, ඵලදායිතාවය වැඩිවීම පිළිබඳ සාධක ඇත. මෙයට හේතු වී ඇත්තේ, කර්මාන්තවල පරිමාණය පුළුල් කිරීමත්, ඉහළ ධාරිතා අනුපාතය උපයෝගීකර ගැනීමත් ය.

විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය සේවා, නියුක්තිය සහ ආදයම් කෙරෙහි ද වාසිදයක බලපෑමක් ඇති කරනු ඇත. විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය නිසා මෙම අංශයට ඇතිවුන බලපෑම මැනීම අපහසුය. සේවා නියුක්තිය සහ ආදයම් කෙරේ ඇති වූ බලපෑම රඳා ඇත්තේ (1) නිමැවුම් ප්‍රසාරණය, ධාරිතා උපයෝගී කර ගැනීම සහ කර්මාන්ත කටයුතුවල පරිමාණය පුළුල් කිරීම, සහ (2) වගාවන් වැඩි දියුණු කිරීම හා සුළු නිෂ්පාදිත අපනයනයන් දිරි ගැන්වීම යන කරුණුමතය. පෞද්ගලික අංශයේ, කෘෂිකාර්මික, තැනීම් සහ සේවා කර්මාන්තවල නිමැවුම වැඩිවීමට බොහෝ සෙයින් ම හේතු වූයේ ආයෝජන කිරීම් සහ ධාරිතා උපයෝගීතාවය ඉහළ මට්ටමට එළැඹීමය. මෙම කරුණු දෙකට ම විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය ආධාර වූ අතර, මෙම අංශයේ ආදයම සහ සේවා නියුක්තිය ද වැඩි කරන ලදී. ද්විතීය සහ තෘතීය බලපෑම් පසුව දැනෙන්නට ඉඩ ඇති අතර, ශ්‍රම ඵලදායිතාවයේ ආන්තික වෙනස්වීම්වලට මෙය වඩාත් බලපානු ඇත.

ආදයම් කෙරෙහි වි. වි. හි. ස ක්‍රමයේ බලපෑම මනිනු ලබනුයේ, නිෂ්පාදිතයේ දී එකතු කළ වටිනාකම් (වැටුප්, බදු, කුලී, පොළී සහ ලාභ ) වල වැඩිවීම මගිනි. මෙම අංශයේ මුදල්වලින් අගයන විට, '' එකතු කළ වටිනාකම '' සියයට 23.1 කින් වැඩි වූ අතර, මූර්ත වශයෙන් බලන විට, සියයට 16.9 කින් වැඩි වුණි. ශ්‍රම සූක්ෂම කර්මාන්තයන් වන රසකැවිලි සහ ඇඳුම් මැසීමේ කර්මාන්තයෙහි නිෂ්පාදනය විශිෂ්ඨ අන්දමින් වැඩි විය.

මෙම ක්‍රමයේ එක් ප්‍රධාන අරමුණක් වූයේ සුළු නිෂ්පාදිතයන් ගේ අපනයනයන් නඟාලීමය. සුළු නිෂ්පාදිතයන් ගෙන් ලැබුන විනිමය ඉපැයුම රුපි. දශ ලක්ෂ 152.7 කට හෙවත් ඩොලර් දශ ලක්ෂ 25.6 කට සමාන වූ අතර, ඉකුත් වසරේදීට වඩා රුපි. දශ ලක්ෂ 263 කින් හෙවත් ඩොලර් දශ ලක්ෂ 4.4 කින් වැඩි විය. වි. වි. හි. ස. ක්‍රමය අපනයනයන් කෙරෙහි බලපා ඇති අන්දම තක්සේරු කිරීමට තරම් තවම කල් පැමිණ නැත. සුළු අපනයනයන් බොහොමයක් ම

කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය හෝ දේශීය කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය මත රඳා පවත්නා ඒවා විය. මේ කෘෂිකාර්මික ද්‍රව්‍යයන් ගේ සැපැයුම් නම්‍යතාවය පහත් බැවින් අපනයනයන් වෙතට විදේශ පාරිභෝජනය පුළුල් ලෙස හැරවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයනයන්හි ක්ෂණික ප්‍රසාරණයක් ඇති වනු ඇත. දේශීය වෙළෙඳ පොලේ ප්‍රමාණය සුළුවීම නිසා, ප්‍රමාණවත් පරිදි එවැනි පාරිභෝජන හැරවීමක් ක්ෂණිකව සිදු වෙතැයි බලාපොරොත්තු විය නොහැකිය. එහෙයින්, වි . වි. හි. ස. ක්‍රමය නිසා ඇති වන සුළු අපනයනයන් හි ප්‍රතික්‍රියාවන් තරමක් පමාවීමට ඉඩ ඇත.

දේශ සංචාරක ඉපැයීම්, පෞද්ගලික ප්‍රාග්ධනය සහ වෘත්තිය ඉපැයීම්වලට දැඩි ලෙස පෙලඹවීම් ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදෘෂ්‍යමාන ඉපැයීම් වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තු විය. දේශ සංචාරක ඉපැයුම් 1967 දී එ. ජ. ඩොලර් දශ ලක්ෂ 0.78 සිට 1968 දී එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1.2 දක්වා ඉහළ නැඟුණි. 1968 මැයි–දෙසැම්බර් කාලය අතරතුර දී 1967 දී එම කාලය සමග සංසන්දනය කර බලන කල, ඒකජන එ. ජ. ඩොලර් ඉපැයීම් 52.2 සිට එ. ජ. ඩොලර් 65.3 දක්වා සියයට 25.3 කින් වර්ධනය විණ. 1968 දී පෞද්ගලික ප්‍රාග්ධන සංචලනය දශ ලක්ෂ 2.3 කින් හෙවත් එ. ජ. ඩොලර් 3,49,500 කින් වර්ධනය විය. වි. වි. හි. ස. ක්‍රමය හඳුන්වා දීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අදෘශ්‍යමාන ඉපැයීම්හි තරමක් දුරට වාසිදායක ප්‍රතිචාරයන් මෙපරිදි ඇතිවිණි. ගෙවුම් ශේෂයෙහි අදෘෂ්‍යමාන ගිණුම විසින් 1968 වර්ෂය සඳහා රුපියල් දශ ලක්ෂ 20 ක බැර ශේෂයන් පිළිබිඹු කරන ලදී.

1968 මැයි සිට දෙසැම්බර් දක්වා මෙම ක්‍රමය ක්‍රියාත්මකවීම පෙන්වන්නක් නම්, 1968 මුළු වෙළෙඳ ආනයනයන් ගෙන් ආසන්න වශයෙන් සියයට 13 ක් විවෘත පොදු බලපත්‍ර ගණය යටතේ කෙරුණු භාණ්ඩ ආණයනවලින් සමන්විත වූ බවයි. 1968 දෙසැම්බර් දක්වා ණයවර ලිපිවලින් සියයට 51 ක් පමණ නිෂ්පාදිත භාණ්ඩ සඳහා වූ අතර, සියයට 24 කින් සැදුණ යන්ත්‍ර සහ පරිවහන උපකරණ ගණය, වැදගත්කම අතින් දෙවෙනි තැන හිමි කරගත්තේය.

විවෘත පොදු බලපත්‍ර ආනයනයන් වෙනුවෙන් වූ ඉල්ලුමේ හැසිරීම කෘෂිකර්මයේ වටිනාකම හා කර්මාන්ත නිෂ්පාදනය සහ පොදු වශයෙන් දේශීය ආර්ථික ක්‍රියාවලිය, ආදයම් සහ මූල්‍ය ප්‍රසාරණ අනුග්‍රහය යනාදී විචලනතාවය මත රඳා පවත්නා බව කෙසේ නමුදු සඳහන් කළ යුතු ය. මෙම ගණයේ භාණ්ඩයන් සඳහා පවත්නා ඉල්ලුම කෙරෙහි මෙම විචල්‍යතාවයන් සියල්ලකම හෝ ඉන් කිහිපයක ම ඇති වූ වෙනසකින් ඍජු ප්‍රතිවිපාකයන් ඇති වන්නට ඉඩ තිබුණි. එබැවින් මූල්‍ය පාලනය අතිශය වැදගත් කමකින් යුක්ත බැවින්, ද්‍රව්‍යයන් ගේ එකතුවීම හේතු කොට ගෙන හෝ එසේත් නැතිනම් ඉල්ලුමෙහි වර්ධනය හේතු කොට ගෙන හෝ විවෘත පොදු බලපත්‍ර ගණයේ ආනයනයන් කෙරෙහි පවත්නා ඉල්ලුමෙහි සැලකිය යුතු තරමේ වර්ධනයක් පවත්නේ නම්, එයට ඉතාමත් ම සුපරීක්ෂාකාරී පරිපාලනයක් අවශ්‍ය වනු ඇත. ගෙවීම්වල විස්තර වශයෙන් දක්වා ඇති ගණයන් වෙනුවෙන් විදේශීය විනිමයෙහි ලාබ ගත හැකි බව විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය මගින් බොහෝදුරට සහතික කරනු ලබයි. ස්ථිර වශයෙන් ම, මෙම මිල වෙළෙඳ පොලෙහි ඉල්ලුම් කරන ලද සහ සැපැයුම් කරන ලද විදේශීය විනිමයෙහි ශ්‍රිතයක් විය යුතු ය. අපනයනයන් ගේ තරඟකාරිත්වයෙහි අඩුකිරීමක් හෝ ලෝක වෙළෙඳ පොලේ අයහපත් තත්වයන් හෝ කරණකොට ගෙන විදේශීය විනිමය සැපැයුමේ අඩු වීමක් ඇති වූ විට, විදේශීය විනිමය වෙළෙඳ පොලෙහි වර්තන තත්වයන්ට නොගැලපෙන මිලකට විනිමය ලබා දීම නොකඩවා කරගෙන ගියහොත්, එය හේතු කොටගෙන රටෙහි විදේශ විනිමය සංචිතයන් කෙරෙහි අයහපත් ප්‍රති විපාකයක් සිදුවනු ඇත. මෙපරිද්දෙන්, විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර මිල පිළිබඳව හැකි තරම් සුපරීක්ෂාකාරී අවධානය අවශ්‍ය වෙයි. එක්වරටම, මෙම ක්‍රමය සඳහා සහයෝගය දීමට මූල්‍ය සහ රාජ්‍ය මූලය ක්ෂේත්‍රවල අනුපූරක ක්‍රියාමාර්ගයන් අවශ්‍ය පාලන නීති මත අඩු වෙන් රඳා පවත්නා අර්ථක්‍රමයක් තුළ ඉල්ලුම කෙරෙහි එවැනි ප්‍රතිපත්තියක් බලපෑම ඉක්මනින් පෙන්නුම් කරන නිසාය.

### (ආ) මූල්‍ය ප්‍රතිපත්තිය

1968 මූල්‍ය ප්‍රතිපත්ති සැකැසීමේ දී සැලකිල්ලට ගත් කරුණු අතර, පසුගිය අයවැය හිඟයෙන් උද්ගත වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතු කොට අර්ථ ක්‍රමයෙහි ඇති වූ අධික ද්‍රවශීලතාවය ප්‍රධාන විය. එසේ ම 1967 නොවැම්බර් මස තුළ අවප්‍රමාණයෙහි සහ 1968 මැයි මාසයේ දී ඇති කළ විනිමය සංශෝධනවල පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම මූල්‍ය ප්‍රතිපත්තිය හැඩගැස්විය යුතු විය. මෙම තත්වය යටතේ මූල්‍ය ප්‍රතිපත්තිය සාමාන්‍යයෙන් යොමු වනුයේ සීමාකාර වීම සඳහා ය. 1967 අවසානයේ දී පැවැති උසස් මට්ටම්වලම සංචිත අනුපාතයන් පවත්වා ගෙන යනු ලැබීය.

පොළී අනුපාතයන් ද වැඩි කිරීමට සිදු වූ අතර, බැංකු පොළිය සියයට 5 හේ සිට සියයට $5\frac{1}{2}$ දක්වා වැඩිවීම, අනිකුත් පොදු අනුපාතයන් ඉහළ දැමීමට සංඥාවක් විය. වෙළෙඳ බැංකු පොළී අනුපාතයන් මේ අනුව ඉහළ ගිය අතර, මහ බැංකුවේ මූලිකත්වයෙන්, රජයේ දිගු කාලීන සුරැකුම්පත් සියයට $4\frac{1}{2}$ සිට සියයට $5\frac{1}{2}$ දක්වා වැඩි කරනු ලැබීය. භාණ්ඩාගාර බිල්පත් අනුපාතය ද අවස්ථානුරූපීව, ජනවාරි මාසයේ දී සියයට 3.22 න් 1968 ජූනි මස සිට සියයට 3.64 දක්වා ඉහළ ගියේ ය. මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් ගෙවූ අනුපාතය සියයට 1 සිට සියයට 2 දක්වා 1968 නොවැම්බර් මාසයේ දී වැඩි විය. ස්ථාවර සහ ඉතිරි කිරීමේ තැන්පතු අනුපාතයන් පිළිවෙලින් සියයට $3\frac{1}{4}$ සිට $3\frac{1}{2}$ දක්වා සහ සියයට 3 සිට, $3\frac{1}{4}$ දක්වා ඉහළ ගියේ ය.

අන්තැනක සාකච්ඡා වී ඇති පරිදි, බැංකු මගින් පෞද්ගලික අංශය වෙත සැපැයූ ණය සම්බන්ධයෙන් ද මහ බැංකුව විසින් උපරිම සීමාවන් පනවන ලදී. මෙම විධිවිධානයන් ගැනීමෙන් කෙසේ වුවද, ආර්ථිකයේ වැදගත් සහ වර්ධනය වෙමින් පවතින අංශයන් සීමා කිරීම වැලැක්වීමට මහ බැංකුව අතිශයින් උනන්දු විය. මේ අනුව, උදහරණයක් වශයෙන්, නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දුන් ණය මුදල් සහ ආනයනයන් සඳහා දුන් ණය මුදල් ද මෙම උපරිම සීමාවන් ගෙන් වෙන් කරනු ලැබීය. රජයේ සංයුක්ත මණ්ඩලවලට දුන් ණය ප්‍රමාණය මෙයින් ඉවත් කිරීම වෙනුවෙන් කරුණු දක්වීම අවශ්‍ය වේ. පසුගිය අවුරුදුවල දී රජයෙන් ණය මුදල් ලබාගත් මෙම සංයුක්ත මණ්ඩලයන්ට, බැංකු ක්‍රමයෙන් ණය මුදල් ලබා ගැනීමට සිදු වූ හෙයින් මේ ණය ගැනීම් නිසා රජයේ ණය අවශ්‍යතාවයන් අඩු වී ගිය බව මතක් කළ යුතු ය. සංයුක්ත මණ්ඩලවලට දුන් ණය ද ණය සම්බන්ධයෙන් පැන වූ උපරිම සීමාවට ආරම්භයේ සිට ම ඇතුළත් කළේ නම් ඔවුන් ගේ කටයුතු අනවශ්‍ය ලෙස සීමාවීමට ඉඩ තිබුණි. 1968 දී විශේෂයෙන් ම මෙම අංශයට දුන් ණය ප්‍රමාණයෙහි සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රසාරණයක් සිදුවූ නිසා, රජයේ සංයුක්ත මණ්ඩලවලට දෙන ණය අනාගතයේ දී යම් දිනක සීමාකිරීම ගැන සැලකිලිමත් වියයුතු වනු ඇත.

රජයේ මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම අයවැය ලේඛනයේ සඳහන් වූ ප්‍රමාණයටත් වඩා විශාල වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1968 මූල්‍ය ප්‍රතිපත්තියට පැවැරී තිබුණු කාර්යය තවත් දුෂ්කර විය. රුපි. දශ ලක්ෂ 96 කට ප්‍රසාරණය බලපෑම සීමා කළ 1967/68 අයවැය ලේඛනය, අවසානයේ දී රුපි. දශ ලක්ෂ 267 ක තරමේ ප්‍රසාරණාත්මක පරතරයක් පෙන්නුම් කළාය. මෙම වැඩිවීමෙන් කොටසක් අවප්‍රමාණයෙහි ප්‍රතිඵල වශයෙනුත්, අනෙක් කොටස අය–වැය ලේඛනය සකස් කරන අවස්ථාවේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ලෝක වෙළෙඳ පොලෙහි සහල් මිල ඉහල යාම නිසාත් සිදු විය. අය–වැය ලේඛනයෙහි ප්‍රසාරණාත්මක බලපෑමෙන් ඇති වූ අහිතකර ප්‍රතිඵලයන් විදේශීය බැංකු වත්කම් රුපි. දශ ලක්ෂ 116 කින් පහළ යාම සහ පෞද්ගලික අංශය වෙත ණය ප්‍රසාරණය කිරීම සම්බන්ධයෙන් වූ සීමා තවදුරටත් පවත්වා ගැනීම් මගින් මර්ධනය කරනු ලැබීය. මෙසේ තිබිය දී ද, පෞද්ගලික අංශයට සැපයූ ණය ප්‍රමාණය මෙතෙක් වාර්තා වී ඇති ඉහළ ම මට්ටමක පැවැතුනි.

මේ අනුව රාජ්‍ය අංශයෙන් උද්ගත වූ විශාල ප්‍රසාරණාත්මක බලපෑමක් පැවැතිය ද, 1968 දී උසස් මට්ටමක මූල්‍ය ස්ථායිත්වයක් පවත්වා ගැනීමට මහ බැංකුව සමත් විය. සියයට 8.2 ක් වූ, 1968 මූර්ත නිෂ්පාදනයෙහි වර්ධන අනුපාතය, ඉකුත් වර්ෂයට වඩා සියයට 6.9 කින් ඉහළ ගිය මුදල් සැපැයුමෙහි සාමාන්‍ය මාසික මට්ටමේ වර්ධනයට වඩා වැඩි විය. 1968 මුදල් සැපැයුමෙහි වැඩිවීම 1967 ට වඩා අඩු වුව ද, ඉකුත් වර්ෂයන්හි ප්‍රසාරණාත්මක ප්‍රතිපත්තිවලින් උද්ගත වූ උද්ධමනකාරී පීඩනයන් තවදුරටත් පැවතුනි. මෙය, පාරිභෝගික මිල දර්ශකයට අනුව සියයට 5 න් ඉහළ ගිය මට්ටමින් විද්‍යාමාන වූයේ ය. සාමාන්‍ය මිල මට්ටමෙහි නියම ඉහළ යාම පාරිභෝගික මිල දර්ශකයෙන් පිළිබිඹු නොවේ. ද්‍රවශීල වත්කම් විශාල ප්‍රමාණයක් දැරීම සහ පුද්ගලික ආදයම් උසස් මට්ටමක පැවැතීම ඇතුළු ඉහළ පාරිභෝජන නැමියාව මිල මට්ටම කෙරෙහි පීඩනයක් ඇති කළේ ය. මේ අනුව, ජාතික නිෂ්පාදිත පිළිබඳ සංඛ්‍යා සකස් කිරීමේ දී යොදනු ලබන '' මිල අවපාතිකය '' සියයට 11 කින් වැඩි විය. නොයෙකුත් අංශයන් හී මිල ඉහළ යාම එකම ආකාරයකට සිදු නොවිය. විශේෂයෙන්ම කාර්මික භාණ්ඩ සහ ආනයනවල මිල ඉහළයාමක් පෙන්නුම් කළේ ය.

ද්විත්ව විනිමය අනුපාතයක් ඇති කිරීමත් සමගම, සැලකිය යුතු ලෙස විදේශීය වෙළෙඳාම සහ ගෙවීම් සම්බන්ධ කටයුතු ලිහිල් කරනු ලැබීය. එනමුත් මෙම ලිහිල් කිරීමේ විෂය ප්‍රමාණය රඳනු ඇත්තේ දැනට ඇති සම්පත් මගින්, සමස්ත ඉල්ලුමෙන් ඉටු කිරීමට හැකි ප්‍රමාණය අනුවය. මෙයින්, දේශීය නිෂ්පාදනය සහ ආනයනයන් තුලින් සැපැයුමෙහි වර්ධනයක් ඇති වනු ඇත. පසුගිය වර්ෂයෙහි වාර්ෂික වාර්තාවෙහි දක් වූ පරිදි, විදේශීය වෙළෙඳ සහ ගෙවීම්

සම්බන්ධයෙන් අපිළිවෙළකට කරන ලිහිල් කිරීමක ප්‍රතිඵලය වනු ඇත්තේ, නිමැවුමෙහි ප්‍රමාණවත් වැඩිවීමක් සහ වැඩි වූ කාර්යක්ෂමතාවයක් ද නොමැතිව, විදේශ සංචිතයන් අපතේ යාමය.

වි. වි. හි. ස. ක්‍රමය ඇති කරනු ලැබුවේ අනිකුත් විධිවිධානයන් සමග වියදම් සීමා කිරීම්වලින්, ප්‍රමාණාත්මක සීමා කිරීම් වෙන් කිරීමටය. වියදම් සීමා කිරීම්වල සාර්ථකත්වය ප්‍රධාන වශයෙන් රඳනුයේ අතිරික්ත වියදම් අඩු කිරීමට, මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය විධිවිධානයන් කෙතරම් දුරට දක්ෂ වන්නේ ද යන්න මතය. වියදම් සීමා කරන මිල යන්ත්‍රය සම්පත් වෙන් කිරීමේ ද බලවේගය වන්නේ ය. ආනයන ප්‍රමාණය සහ සැකැසුම වෙත අධිකාරීන් බලපානු ඇත්තේ, ආනයන භාණ්ඩ රාශියක දේශීය මිල ඉහළ දැමීමෙනි. මිල මට්ටම, විශේෂයෙන්, විදේශ විනිමය මිල, ගෙවුම් ශේෂයෙහි සම තුලිතතාවය ඇති කිරීම සහ පවත්වා ගෙන යාමට උපකාරී වේ. මේ අතරම, අර්ථ ක්‍රමයෙහි වර්ධන අංශයන්ට බාධා නොවෙන පරිදි ණය අරමුදල් ලබා ගත හැකිවීම හා එහි මිල පැවතිය යුතුය. බැංකු ණය ද ඇතුළුව, ලබා ගත හැකි සම්පත්වලින් වැඩි කොටසක් තමන්ට ලබා ගැනීමට නොයෙකුත් අංශයන් මිල ඉහළ නංවමින් තරග කරනු ඇත. ණය මුදල්වල ලබාගත හැකි කම සහ ඒවායේ ගාස්තු සකස් කිරීම මූල්‍ය අධිකාරීන්ට පැවරෙන ප්‍රධාන හා දුෂ්කර කාර්යයක් වේ.

අර්ථ ක්‍රමය, දැනුදු ඉහළ මට්ටමෙහි ද්‍රවශීලතාවයකින් යුතු වේ. 1968 දී මුදල් හා ආසන්න මුදල් සහ දල දේශීය නිෂ්පාදිතය අතර වූ අනුපාතය සියයට 43.8 විය. වර්තමාන මූල්‍ය ප්‍රසාරණ කටයුතු සුදුසු සීමාවන් තුළ පවත්වා ගෙන යාම හැර මෙම අතිරික්ත ද්‍රවශීලතාවය මගින් ගෙවුම් ශේෂ වෙත සහ දේශීය මිල මට්ටම වෙත අනවශ්‍ය පීඩනයක් ඇති නොකිරීමට, මූල්‍ය ප්‍රතිපත්තිය වග බලාගත යුතු ය. මේ අනුව, 1968 දී මූල්‍ය කටයුතු සතුටුදායක වී ඉහළ මට්ටමක ස්ථායිත්වයක පැවැතිය ද තෘප්තියකට පැමිණිය නොහැකි ය. අර්ථ ක්‍රමයෙහි මූල්‍ය ප්‍රසාරණය දෙස පරීක්ෂාකාරීව බැලිය යුතු වන අතර, මේ සම්බන්ධයෙන් රජයේ අය–වැය ලේඛනයෙහි මූල්‍ය කටයුතු සීමා කිරීමේ අවශ්‍යතාවය අමුතුවෙන් කිව යුතු නැත.

## (4) නිගමනය

1968 වර්ෂයේ දී ආර්ථිකයේ සතුටුදායක හැඩගැස්මට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය පරිභෝජනය සඳහා කරන නිමැයුම පුළුල්වීමය. ආර්ථිකයේ වර්ධන වේගය වන සියයට 8.3 ජන සංඛ්‍යාවේ, වර්ධන වේගය ඉක්මවා ඇති අතර, ඒකජන මූර්ත ජාතික ආදායමේ වාර්ෂික වර්ධන වේගය සියයට 6.1 ක් විය. පෞද්ගලික අංශයට සැපයූ ණය ප්‍රමාණය ඉහළ යාමක් හා අයවැය ලේඛනයෙන් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑමක් පැවතියද, මූල්‍ය ස්ථාවරත්වය ඉහළ මට්ටමක තිබුණි. සැපයුම් තත්වය සැහෙන තරමින් දියුණු වුවත්, ඉහල ඉල්ලුම් මට්ටම හා සාපේක්ෂව බලන කළ ආර්ථිකයේ සමහර අංශවල හිඟකම් පැවතුණි. මිල මට්ටම ඉකුත් වර්ෂවලදීට වඩා වේගයෙන් ඉහළ ගියේය. ගෙවුම් ශේෂයේ නොකඩවා පැවති හිඟයන් නිසා විනිමය ක්‍රමයෙහි සංශෝධන ඇති කිරීම අවශ්‍ය විය. 1968 දී සිදු වූ වෙනස්කම් අතර වි.වි.හි.ස. ක්‍රමය ආරම්භ කිරීම වැදගත්ය. තාත්වික විනිමය අනුපාතිකයක් සාක්ෂාත් කර ගැනීම හැරුනාම, ලබා ගත හැකි අමු ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කිරීම මගින් කර්මාන්ත නිමැයුම හා සුළු අපනයනවල ප්‍රමාණය පුළුල් කිරීමට උදව් විය. කෙසේ වෙතත් ගෙවුම් ශේෂ තත්වය රුපියල් අනුව බලන කළ 1968 දී 1967 දී තරම් වාසි සහගත නොවුනත්, ඩොලර් අනුව බලන කල දියුණුවක් පෙනුණි.

## සංඛ්‍යා සටහන II (අ) 1

## නිෂ්පාදනය හා වියදම් සඳහා සාරාංශ දර්ශකය

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (අ) වටිනාකම් | | | | | | | | | | |
| 1. දළ ජාතික නිෂ්පාදිතය සාධක වියදම් මිල අනුව (රුපි. දශ ලක්ෂ) ... ... | 5,893 | 6,287 | 6,313 | 6,503 | 6,797 | 7,291 | 7,484 | 7,699 | 8,224 | 9,809 |
| 2. දළ දේශීය වියදම වෙළෙඳ මිල අනුව (රුපි. දශ ලක්ෂ) ... ... ... | 6,600 | 6,909 | 6,939 | 7,069 | 7,389 | 7,958 | 8,051 | 8,627 | 9,317 | 10,626 |
| 3. පෞද්ගලික පාරිභෝජනය වෙළෙඳ මිල අනුව (රුපි. දශ ලක්ෂ) ... ... ... | 4,636 | 5,020 | 4,912 | 5,010 | 5,339 | 5,755 | 5,881 | 6,274 | 6,712 | 7,550 |
| 4. රජයේ පාරිභෝජනය වෙළෙඳ මිල අනුව (රුපි. දශ ලක්ෂ) ... ... ... | 881 | 911 | 926 | 979 | 1,011 | 1,090 | 1,157 | 1,158 | 1,228 | 1,408 |
| 5. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, වෙළෙඳ මිල අනුව (රුපි. දශ ලක්ෂ) ... | 1,113 | 978 | 1,102 | 1,080 | 1,160 | 1,113 | 1,013 | 1,195 | 1,377 | 1,668 |
| 6. භාණ්ඩ අපනයන හා සාධක නොවන සේවා (රුපි. දශ ලක්ෂ) ... ... ... | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,937 | 2,095 | 1,865 | 1,849 | 2,165 |
| 7. භාණ්ඩ ආනයන හා සාධක නොවන සේවා (රුපි. දශ ලක්ෂ) ... ... ... | 2,176 | 2,209 | 1,972 | 2,070 | 2,031 | 2,102 | 2,061 | 2,155 | 2,106 | 2,474 |
| 8. දළ ජාතික නිෂ්පාදිතය ඒකජන වශයෙන් සාධක මිල අනුව (රුපි) ... ... | 612 | 635 | 621 | 623 | 638 | 669 | 670 | 673 | 703 | 820 |
| 9. දළ දේශීය වියදම ඒක ජන වශයෙන් (රුපි. දශ ලක්ෂ) ... ... ... | 689 | 698 | 683 | 677 | 705 | 730 | 721 | 754 | 796 | 888 |
| 10. 1959 සාධක වියදම් මිල අනුව දල ජාතික නිෂ්පාදනය (රුපි. දශ ලක්ෂ)... | 5,893 | 6,289 | 6,425 | 6,710 | 6,900 | 7,363 | 7,551 | 7,834 | 8,181 | 8,862 |
| 11. දළ ජාතික නිෂ්පාදිතය ඒක ජන වශයෙන් 1959 සාධක වියදම් මිල අනුව (රුපි. දශ ලක්ෂ) | 612 | 635 | 632 | 643 | 648 | 675 | 676 | 685 | 699 | 741 |
| (ආ) දර්ශක අංක : 1959 = 100.0 | | | | | | | | | | |
| 1. සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදනය ... ... | 100.0 | 106.7 | 107.1 | 110.3 | 115.3 | 123.7 | 127.0 | 130.6 | 139.5 | 166.4 |
| 2. දළ දේශීය වියදම්, වෙළෙඳ මිල අනුව ... | 100.0 | 104.7 | 105.2 | 107.1 | 112.0 | 120.6 | 122.0 | 130.7 | 141.2 | 161.0 |
| 3. වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජනය | 100.0 | 108.3 | 106.0 | 108.1 | 115.2 | 124.1 | 126.9 | 135.3 | 144.8 | 162.9 |
| 4. වෙළෙඳ මිල අනුව රජයේ පාරිභෝජනය | 100.0 | 103.4 | 105.1 | 111.1 | 114.7 | 123.7 | 131.2 | 131.4 | 139.4 | 159.7 |
| 5. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, වෙළෙඳ මිල අනුව ... ... ... | 100.0 | 90.3 | 101.8 | 99.8 | 96.0 | 102.8 | 93.6 | 110.4 | 127.2 | 154.1 |
| 6. භාණ්ඩ අපනයන හා සාධක නොවන සේවා | 100.0 | 99.7 | 94.6 | 97.8 | 94.4 | 96.1 | 103.9 | 92.5 | 91.7 | 107.4 |
| 7. භාණ්ඩ ආනයන හා සාධක නොවන සේවා | 100.0 | 101.5 | 90.6 | 95.2 | 93.3 | 96.6 | 94.7 | 99.0 | 96.8 | 113.7 |
| 8. දළ ජාතික නිෂ්පාදිතය ඒක ජන වශයෙන් සාධක මිල අනුව ... ... ... | 100.0 | 103.8 | 101.4 | 101.7 | 104.3 | 109.2 | 109.5 | 109.9 | 114.8 | 133.9 |
| 9. දළ දේශීය වියදම ඒක ජන වශයෙන් ... | 100.0 | 101.4 | 99.1 | 98.3 | 102.4 | 105.9 | 104.7 | 109.5 | 115.6 | 128.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව